දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
புகையிலை மற்றும் மதுபானம் மீதான தேசிய அதிகாரசபை
National Authority on Tobacco and Alcohol

# 2021
# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# Annual Report

# 2021

# වාර්ෂික වාර්තාව

**NATA**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
புகையிலை மற்றும் மதுசாரம் மீதான தேசிய அதிகாரசபை
National Authority on Tobacco & Alcohol

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

# 01. පෙරවදන

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ (NATA) ජයග්‍රහණ පිළිබඳ තොරතුරු සහ කාර්යසාධනය සහ එය විසින් සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති මත පදනම්ව මෙම වාර්තාව සකස් කර තිබේ. මෙම වාර්තාවෙහි තොරතුරු සපයා ඇත්තේ අධිකාරියේ ප්‍රධාන කාර්ය සාධන පදනම් කර ගනිමින්ය.

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය සහ යහපාලන මාර්ගෝපදේශ ප්‍රකාරව, අධිකාරිය වාර්ෂික වාර්තාවක් පිළියෙල කිරීම අවශ්‍ය වන අතර එය සමන්විත වනුයේ අධිකාරියේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු, වාර්ෂික ගිණුම් සහ විගණකාධිපතිගේ වාර්තාවෙනි.

# 02. පටුන

| | | |
|---|---|---|
| **01.** | **පෙරවදන** | **03** |
| **02.** | **පටුන** | **04, 05** |
| **03.** | **වගු ලැයිස්තුව** | **06** |
| **04.** | **ඡායාරූප ලැයිස්තුව** | **07** |
| **05.** | **සභාපතිතුමාගේ පණිවිඩය** | **08-10** |
| **06.** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ පණිවිඩය** | **11-13** |
| **07.** | **දැක්ම** | **14** |
| **08.** | **මෙහෙවර** | **14** |
| **09.** | **අරමුණු** | **14** |
| **10.** | **කර්තව්‍ය** | **15** |
| **11.** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්** | **16** |
| **12.** | **2021 වසරේ ප්‍රගතිය (2021 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා)** | |
| 12.1 | නෛතික ක්‍රියාමාර්ග | |
| 12.1.1 | බලයලත් නිලධාරීන් විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග | **17** |
| 12.1.2 | අධිකාරිය විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග | **18, 19** |
| 12.2 | අනුකම්ටු ක්‍රියාකාරකම් | |
| 12.2.1 | අනුකම්ටුව දුම්කොළ හා මද්‍යසාර වැලැක්වීම සහ නිවාරණය | **20** |
| 12.2.1.1 | දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ මහජන මත සමීක්ෂණය | **21** |
| 12.2.1.2 | දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ මහජන මත සමීක්ෂණය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව | **21, 22** |
| 12.2.1.3 | දුම්කොළ හා මද්‍යසාර වැලැක්වීම හා නිවාරණය පිළිබද උපදේශන සහතිකපත්‍ර පාඨමාලාව | **23** |
| 12.2.1.4 | ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවත්වනු ලැබූ දුරකථන උපදේශනය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩමුළුව | **24** |
| 12.2.1.5 | 1948 උපකාරක දුරකථන සේවාව පිළිබද තොරතුරු | **24** |
| 12.2.2 | අනුකම්ටුව - දුම්කොළ හා මද්‍යසාර සඳහා බදු සූත්‍රයක් සකස් කිරීම | **25** |
| 12.2.2.1 | සෞඛ්‍ය විශේෂඥයන් හා අදාළ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමග උද්දේශන රැස්වීම | **26** |
| 12.2.2.2 | දුම්කොළ බදුකරණය හා නීති විරෝධී වෙළඳාම පිළිබඳ ලෝ.සෞ. සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු දැනුම් කේන්ද්‍රය පිළිබඳ මාර්ගගත වැඩමුළුව | **27** |

12.2.2.3 දුම්කොළ බදුකරණ සූත්‍රයේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය සාකච්ඡාව **27**

12.2.3 අනුකමිටුව - විකල්ප භෝග **28**

12.2.3.1 නියමු පරීක්ෂණයක් මගින් තිරසර දුම්කොළ වගාවෙන් තොර දිස්ත්‍රික්ක ඇති කිරීම **29-32**

12.2.4 අනුකමිටුව - දුම් රහිත දුම්කොළ **33**

12.2.4.1 දුම් රහිත දුම්කොළ ආශ්‍රිත විද්‍යාත්මක සඟරාව බුලත් විටට සැබෑ අරුතක් සහ සංස්ථා බුලත් සැපේ ආයුර්වේද ඖෂධමය නිෂ්පාදනය දියත් කිරීම **34-36**

12.2.5 අනුකමිටුව - දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීම **37, 38**

12.2.5.1. මාධ්‍ය සම්මාන උළෙල-2021 **38, 39**

12.2.6 අනුකමිටුව - රූපමය සෞඛ්‍ය අවවාද **39**

12.2.7 අනුකමිටුව - වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සඳහා දුම්කොළ මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ විෂය මාලාවක් සංවර්ධනය කිරීම. **40**

12.3 අනෙකුත් වැඩසටහන්

12.3.1 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සමුළුව (NSTAP) - 2021 **42, 43**

12.3.2 පාසල් පෙළ පොත් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය ආශ්‍රිත සෞඛ්‍ය පණිවිඩ සකස් කිරීම පිණිස විශේෂ කමිටුවක් ස්ථාපිත කිරීම **43, 44**

12.3.3 දු.ම.ජා.අධිකාරියේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව ස්ථාපිත කිරීම **45**

**13. අප අධිකාරියේ කාර්ය මණ්ඩලය**

13.1 සාමාන්‍යාධිකාරී බඳවා ගැනීම **47**

13.2 සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම **47**

**14. මූල්‍ය ප්‍රගතිය (2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)**

14.1 මූල්‍ය ප්‍රකාශන **48-51**

14.2 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් **52-60**

14.3 විගණකාධිපති වාර්තාව **61-69**

**15. කළමනාකරණ කණ්ඩායම / කාර්ය මණ්ඩලය**

15.1 සංවිධාන ව්‍යුහය **70**

15.2 2021.12.31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු **71**

# 03. වගු ලැයිස්තුව

වගුව 1 : දු.ම.ජා. අධිකාරිය පනත යටතේ සුරාබදු නිලධාරීන් විසින් පවරා ඇති නඩු **පිටුව 17**

වගුව 2 : දු.ම.ජා. අධිකාරිය පනත යටතේ පොලිස් නිලධාරීන් විසින් පවරා ඇති නඩු **පිටුව 17**

වගුව 3 : 1948 උපදේශන සේවාවට ලැබුණු දුරකථන ඇමතුම් පිළිබඳ තොරතුරු **පිටුව 24**

## 04. ඡායාරූප පෙළ ගැස්ම

| | | |
|---|---|---|
| **ඡායාරූපය 01** | : | අධ්‍යක්ෂ මණ්ඩලය |
| **ඡායාරූප 02,03 සහ 04** | : | වැළැක්වීම සහ නිවාරණ අනුකමිටුව රැස්වීම් |
| **ඡායාරූප 05 ,06 සහ 07** | : | දුම්කොළ හා මද්‍යසාර රෙගුලාසි පිළිබඳ මහජන මත සමීක්ෂණය පිළිබඳ පුවත්පත් සාකච්ඡාව |
| **ඡායාරූප 08 ,09 සහ 10** | : | දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම හා නිවාරණය පිළිබඳ උපදේශන සහතිකපත්‍ර පාඨමාලාව |
| **ඡායාරූප 11 ,12 සහ 13** | : | දුම්කොළ හා මද්‍යසාර සඳහා බදුකරණ සූත්‍රය සකස් කිරීමේ අනුකමිටු රැස්වීම් |
| **ඡායාරූප 14 ,15 සහ 16** | : | සෞඛ්‍ය විශේෂඥයන් සහ අදාළ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමග උද්දේශන රැස්වීම |
| **ඡායාරූප 17,18 සහ 19** | : | දුම්කොළ බදුකරණය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව |
| **ඡායාරූප 20,21 සහ 22** | : | දුම්කොළ වගාව සඳහා විකල්පබෝග හඳුන්වාදීමේ අනුකමිටුවේ රැස්වීම |
| **ඡායාරූප 23,24,25 සහ 26** | : | ගොවීන් සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වූ උද්දේශන වැඩසටහන |
| **ඡායාරූප 27, 28, 29 සහ 30** | : | ගොවීන් සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ පැවැත්වූ උද්දේශන වැඩසටහන |
| **ඡායාරූප 31, 32 සහ 33** | : | නිලධාරීන් සඳහා සංවේදීතා වැඩසටහන, අනුරාධපුරය |
| **ඡායාරූප 34, 35 සහ 36** | : | නිලධාරීන් සඳහා සංවේදීතා වැඩසටහන, මොණරාගල |
| **ඡායාරූප 37, 38 සහ 39** | : | පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන, අනුරාධපුරය |
| **ඡායාරූප 40,41 සහ 42** | : | පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන, මොණරාගල |
| **ඡායාරූප 43,44 සහ 45** | : | දුම්රහිත දුම්කොළ අනුකමිටු රැස්වීම |
| **ඡායාරූප 46,47,48,49 ,50 සහ 51** | : | උත්සවයේ ආරම්භක අවස්ථාව |
| **ඡායාරූප 52,53,54,55,56 සහ 57** | : | ප්‍රධාන කථිකයන් රැස්වීම ඇමතීම |
| **ඡායාරූප 58,59,60,61,62 සහ 63** | : | උත්සවයේ විශේෂ අවස්ථා |
| **ඡායාරූප 64 සහ 65** | : | දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීමේ අනුකමිටුවේ රැස්වීම් |
| **ඡායාරූප 66 සහ 67** | : | වැඩසටහනේ විශේෂ අවස්ථා |
| **ඡායාරූප 68,69 සහ 70** | : | දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිලිබද ජාතික සම්මන්ත්‍රණය - 2021 හි විශේෂ අවස්ථා |
| **ඡායාරූප 71** | : | සාමාන්‍යාධිකාරී සම්මුඛ පරීක්ෂණය |
| **ඡායාරූප 72** | : | සංවර්ධන නිලධාරී පත්වීම ප්‍රදානය කිරීම |

# 05. සභාපතිතුමන්ගේ පණිවිඩය



කොවිඩ්-19 වසංගත තත්ත්වය මතු වී වසරක් ගත වූ පසුව ද, පාලනය ස්ථාපිත කරන්නා වූ ක්‍රමවත් ව්‍යුහයන් දුර්වල කරමින් අස්ථාවර කිරීමට එය සමත්ව තිබේ. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ ව්‍යාපෘතීන් අවහිර කිරීමට ප්‍රයත්න දරන දැවැන්ත බාධකයක් බවට එය පත්ව ඇත. කෙසේ වෙතත්, අධිකාරියේ දැඩි කැපවීමෙන් හා වෙහෙස නොබලා කටයුතු කරන කණ්ඩායමේ කාර්යයන් කෙරෙහි එමගින් ඇති කළේ අල්ප බලපෑමකි. දුම්පානය හා මධුලෝලිතාවට එරෙහිව ව්‍යාපාර සාර්ථකව පුනර්ජීවන කරන සැලසුම් කිහිපයක් මෙම කාල පරිච්ඡේදය තුළ සැලසුම් කර ක්‍රියාවට නංවනු ලැබීය. 2021 වසර තුළ ගෝලීය දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම සම්බන්ධයෙන් ගත් කළ විද්‍යමාන වනුයේ කර්මාන්තය සතු ශ්‍රී ලංකාවේ ග්‍රහණයේ තවත් දැඩි වීමකි. කොවිඩ් අර්බුදය මධ්‍යයයේ උදා වූ අවස්ථාවන්ගෙන් දුම්කොළ සහ මද්‍යසාර කර්මාන්ත නිසි ඵල ප්‍රයෝජන ලබා ගනිමින් අවදානම් පාත්‍ර ජන කණ්ඩායම් කෙරෙහි එහි යොමුව ව්‍යාප්ත කර තිබේ.

එබඳු එක් ජන කොටසක් වනුයේ බාල වයස්කාර දරුවන්ය. තම නිෂ්පාදන බාල වයස්කරුවන්ට අලෙවි කොට ඒවායේ ප්‍රවේශ්‍යතාවය ඉහළ නැංවීමට කර්මාන්තය අරමුණු කරයි. බදු ගෙවිය යුතු අරමුදල් සැලකිය යුතු ප්‍රමාණයකින් බේරී යාමට සමාගම්වලට ඉඩ සලසන වත්මන් බදුකරණ ප්‍රතිපත්තිය ද ඒ කෙරෙහි දායක වේ. මෙම තත්ත්වය කෙරෙහි පිළියම් යෙදීමට අප අධිකාරිය බොහෝ යාන්ත්‍රණ සකස් කර තිබේ. ඉන් පළමුවැන්න වනුයේ දුම්කොළ හා මද්‍යසාර පරිභෝජනය සඳහා වන අවම වයස ඉහළ නැංවීමට සැලැස්මක් හඳුන්වා දීමයි. දුම්කොළ හා මද්‍යසාර සමාගම් අවුරුදු 21 ට අඩු අය ඉලක්ක කරමින් තම නිෂ්පාදනය ප්‍රචාරණය කරන බැවින් අවුරුදු 21 වසස් සීමාව ඵලදායක නොවේ. මාධ්‍ය තුළ එවැනි නිෂ්පාදන ප්‍රචාරණය හා රොමැන්තිකරණය හේතුවෙන් තාර්කික තේරීමක් සිදුකිරීමට පුද්ගලයන්ට අවකාශයක් නොමැත. එබැවින් එම කර්මාන්ත මගින් සිදු කරනු ලබන තීව්‍ර අධිශික්ෂණය හා බලපෑම බැහැර කිරීම පිණිස අවුරුදු 24 ප්‍රමාණවත් නිදහස් අවකාශයක් සපයයි. කර්මාන්තය විසින් සිදුකරනු ලබන බලපෑම්වලට එරෙහිව ගත හැකි තවත් ප්‍රති ක්‍රියාමාර්ගයක් වනුයේ නව බදුකරණ ප්‍රතිපත්තියක් ඇති කිරීමයි. එවැනි නිෂ්පාදනවල ප්‍රවේශ්‍යතාව අඩුකරන අතර බදු අයකළ හැකි ධාරිතාව උපරිම කිරීම සඳහා නව සූත්‍රයක් යෝජනා කරනු ලැබ තිබේ. බදුවලින් ලැබෙන මුදල් සහ දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත වැළැක්විය හැකි රෝග සඳහා වැය කරනු ලබන මුදල් අතර විසංසන්දනය සැලකිය යුතු තරම් උග්‍රය. මෙම කරුණුවලට අදාළව රජය අලාභ අත් විඳිමින් සිටින අතර දුම්පානයෙන් මතුවන අනර්ථයන් සඳහා සාර්ථකව හානි පූරණය කිරීමට බදුකරණ ප්‍රතිපත්තිය වත්මනෙහි ක්‍රියාත්මක නොවන බවට එය පැහැදිළි සාක්ෂියකි. යෝජිත බදුකරණ ප්‍රතිපත්තියෙන් පරිබාහිරව, යම් නිශ්චිත දුම්වැටි වෙනුවෙන් රජය වඩා ඉහළ මිල සීමාවක් පනවා තිබේ. මිල ඉහළ යාම දුම්කොළ විශාල ප්‍රමාණවලින් මිලදී ගැනීම වඩා දුෂ්කර කාර්යයක බවට පත්කරන අතර බාල වයස්කරුවන්ට එවැනි වියදමක් දැරීමට හැකි වැය කළ හැකි ආදායමක් නොමැති බැවින් මෙමගින් ඔවුන් එවැනි මත්ද්‍රව්‍ය මිලදී ගැනීමෙන් වළක්වාලයි.

ශ්‍රී ලාංකීය සමාජයේ සමාජීය ප්‍රතිමාන සහ මූලධර්ම ප්‍රතිව්‍යුහගත කරන්නාවූ ප්‍රවේශයක අවශ්‍යතාව දු.ම.ජා.අධිකාරිය පිළිගනියි. පවත්නා තත්ත්වය විශේෂයෙන්ම දුම්වැටි හා මද්‍යසාර භාවිතා කිරීමේ ප්‍රවණතා අගය කරන්නාවූ තරුණ පිරිස් අතර ඒවා භාවිතය ප්‍රවර්ධනය කරයි. මෙවැනි භාවිතාවන් ඇතැම් අවකාශයන්හි සමාජ සවලතාවට ඉඩ සලසන අතර සමාජීය අන්තර්ක්‍රියා සඳහා වැදගත් අවශ්‍යතාවයක් ලෙස බොහෝ දෙනෙකු දකියි. එවැනි දෝෂ සහගත පර්යාලෝකයක් ප්‍රගතියට හානිකර හා අප්‍රතිභාන වේ. වඩා ශක්තිමත් හා වඩා ධනාත්මක ප්‍රතිමාන මගින් එවැනි ප්‍රතිමාන ප්‍රතිස්ථාපනය කළ යුතු බව අධිකාරිය පිළිගනියි. දුම්කොළ හා මද්‍යසාර අවභාවිතය පිළිබඳ ප්‍රජාවේ දැනුම හා ප්‍රත්‍යාස්ථිතිය ශක්තිමත් කරන දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මෙය සිදුකරනු ලැබේ. දුම්කොළ හා මද්‍යසාර ව්‍යාප්තිය මර්ධනය කිරීම සඳහා වන ක්‍රමවේදවල විප්ලවීය වෙනසක් කරන්නා වූ යාන්ත්‍රණ පිළිබඳ කතිකාවත හා චින්තන ප්‍රේරණය කරන හා උත්තේජනය කරන ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ වැනි විවිධ වෙනත් ක්‍රියාකාරකම් පවත්වනු ලැබීය. මෙම පුරුදු ප්‍රවර්ධනය කරන අදහස් ශෝධනය කිරීම පිණිස සංස්කෘතික විප්ලවයක් අත්‍යාවශ්‍ය වන අතර එසේ නොවුණහොත් දුම්පානය කිරීමට ඇති ආශාව ප්‍රේරණය කරන මත බහුලව පැවැතීම හේතුවෙන් එවැනි අදහස් කාලයත් සමග ප්‍රතිසංස්කරණය වීම පමණක් සිදුවනු ඇත.

දුම්වැටි හා මද්‍යසාර අවභාවිතයෙන් ජනතාව වළක්වාලිම වැදගත් වන්නා සේම, සඵල පුනරුත්ථාපනය තවත් වැදගත් උපක්‍රමයක් වේ. මෙම ඇබ්බැහිවීම්වලින් පීඩා විඳින්නන් හට ඒවායෙන් ගැලවීමට හැකි මෙවලම් ලබා දිය යුතුය. මෙම කර්තව්‍ය සඳහා, දු.ම.ජා.අධිකාරිය 1948 "Quit Line" උපකාරක දුරකථන සේවාව හඳුන්වා දෙන ලදී. ඇබ්බැහියෙන් මිදීමට අවශ්‍ය පුද්ගලයන් හට පුනර්පතනය වීම අවම කරන වටිනා උපායමාර්ග ලබා ගැනීමට ඉඩ සලසන එය ඉතා ප්‍රයෝජනවත් උපයෝගිතාවයකි. එසේම, දුම්කොළ හා මද්‍යසාර අවභාවිතය අත්හැර දැමීමට තම ප්‍රජාවේ සාමාජිකයන්ට සහාය වන ශිල්පීය ක්‍රම එමගින් කුටුම්බයන්ට හා ජන කණ්ඩායම්වලට ලබා දේ. පූර්ණ නිර්නාමිකත්වය යටතේ පහසුවෙන් සහ නොමිලේ උපදේශනය ලබා දෙනු ලැබේ. වියදම් දැරීමට සිදුනොවීම උපදේශනය ප්‍රවේශ්‍යතාවයේ පහසුව ඇති කරයි. පුද්ගලයන් බොහෝ විට තමන්ට ඇබ්බැහිවීමක් ඇති බව පිළි නොගන්නා අතර සමාජීය හේතුන් ගණනාවක් හේතු කොට ගෙන උපකාර නොපතයි. උපකාරක දුරකථන සේවාව එවැනි බාධක රැසක් ඉවත් කර සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් කරා මංපෙත් විවර කිරීම අරමුණු කරයි.

දුම්කොළ පරිභෝජනයට ගන්නා ක්‍රමවේද රැසක් ඇති බවත් දුම්රහිත දුම්කොළ රටතුළ බහුලව ව්‍යාප්ත වී ඇති බවත් දුම්කොළ හා මද්‍යසාර පිළිබද ජාතික අධිකාරිය හදුනාගෙන තිබේ. බුලත් හා පුවක් සමග දුම්කොළ සැපීම අප සංස්කෘතිය හා බැඳී පවතින්නකි. දුම්කොළ වලට අමතරව පුවක් වල ද මිනිස් සිරුරට අහිතකර පිළිකාකාරක සංඝටක අන්තර්ගත වේ. එවැනි නිෂ්පාදන අවභාවිතය මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාවට බලවත් හානියකි. එබැවින්, දුම්රහිත දුම්කොළ භාවිතය අධෛර්ය කිරීම පිණිස අධිකාරිය බොහෝ සැලසුම් ක්‍රියාවට නංවා තිබේ. එවැනි දෑ පරිභෝජනය තහනම් කිරීම එබඳු එක් ක්‍රියාමාර්ගයකි. කෙසේ වෙතත්, තවත් බොහෝ සාධනපත්‍ර මගින් නීතිය තවදුරටත් ශක්තිමත් කළ යුතුව තිබේ. තෙවැදෑරුම් අරමුණු සැලකිල්ලට ගනිමින් මෙය සිදු කරනු ලැබේ. පළමු අරමුණ වනුයේ ප්‍රතිපත්තිය විශ්ලේෂණය කර එහි ඇති දුර්වලතා හඳුනා ගැනීමයි. නීතියේ අප්‍රමාණවත් බවෙහි ප්‍රතිඵලය වනුයේ ප්‍රායෝගිකව එය යොදා ගැනීම දක්නට නොලැබීමයි. දෙවන අරමුණ වන්නේ ප්‍රතිපත්ති සම්පාදකයන් ඉලක්ක කිරීම සහ වඩා ප්‍රමාණාත්මක ක්‍රමික වෙනසක් ප්‍රේරණය කිරීමයි. නීති වෙනස් කිරීමේ ධාරිතාවය සහිතව ජනතාව දැනුවත් කිරීම ප්‍රගතිය සඳහා තීරණාත්මක වේ. අවසන් අරමුණ වනුයේ තනි දුම්වැටි අලෙවිය සඳහා පැවැතීම නීති විරෝධී බවට

පත් කිරීමයි. දුම්වැටි පැකට්ටුවක් ලෙස මිලදී ගැනීම සැලකිය ලෙස මිල අධිකය. ළමුන් සහ දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් ඇතුළුව ප්‍රමාණවත් වේතනයක් නොලබන්නන් හට එමගින් දුම්වැටි කෙරෙහි ප්‍රවේශය අඩු කරයි.

දුම්කොළ හා මද්‍යසාර සමාගම් කොටුකර තැබීම පිණිස ගත යුතු තවත් දැවැන්ත පියවර රැසක් ඇති බව අධිකාරිය පිළි ගනියි. මෙම සැලසුම්වලට කාලය අවශ්‍ය වන අතර ඒ සඳහා ප්‍රජාවේ ශක්තිමත් ප්‍රතිචාරය අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ප්‍රගතිය ලඟා කරගත නොහැකි බවක් ඉන් අදහස් නොවේ. දුම්පානය තුරන් කිරීමටත් හා මද්‍යසාර මගින් සමාජය වෙත කෙරෙන බලපෑම බිඳලීමටත් අප අධිකාරිය දැඩි කැපවීමෙන් යුතුව කටයුතු කරයි. සුරා පානයෙන් මත්වීම හා දුම්වැටි අවභාවිතය සමාජ සංවර්ධනය ඌනපූරණය නොකරන අතර ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව පුරා පරිණාමයට බාධකයක්ව පවතී. එළඹෙන සෑම වසරකම, මත්පැන් අනවශ්‍ය ද්‍රව්‍යයක් වන දුම්පානයෙන් තොර ශ්‍රී ලංකාවක් කරා දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ප්‍රවේශ වෙයි. එය වඩා දීප්තිමත් අනාගතයක් දිරි ගන්වන හා ඒ උදෙසා කටයුතු කරන නව්‍යකරණ හා නව යාන්ත්‍රණ පිළිබඳ බලාපොරොත්තු දල්වයි.

**වෛද්‍ය සමාධි ඩබ්ලිව් රාජපක්ෂ**
**සභාපති**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

# 06. අධ්‍යක්ෂ මණ්ඩලයේ පණිවිඩය

2021 ජනවාරි 01 වනදා සිට 31 දක්වා කාල සීමාව තුළ ගනු ලැබූ ප්‍රධාන ප්‍රතිපත්ති තීරණ හා සිදුකරනු ලැබූ වැදගත් ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කරන මෙම වාර්තාව ඔබ සමග බෙදා හදා ගැනීමට හැකිවීම පිළිබඳව දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුටට පත් වේ.



**ඡායාරූපය 1 : අධ්‍යක්ෂ මණ්ඩලය**

පොදුවේ සියලු ආකාරයේ මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමටත් විශේෂයෙන්ම දුම්කොළ හා මද්‍යසාර පාලනය සඳහා දැක්වූ චිරස්ථායී සහ උනන්දුව හා සහයෝගය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත අපගේ බලවත් ප්‍රසාදය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගැනීම යෝග්‍ය වේ. රට තුළ දුම්කොළ හා මද්‍යසාර නිවාරණ වැඩසටහන්වලට නායකත්වය සැපයීම සඳහා වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි විශ්වාසය තැබීම වෙනුවෙන් සහ ඒ සඳහා මග පෙන්වීම ලබා දීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යවරුන් ලෙස කටයුතු කළ නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි මහත්මියටත් ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාටත් අපගේ කෘතවේදීත්වය පළ කරන්නෙමු. බෝ නොවන රෝග සංදර්භය තුළ සහ සෞඛ්‍යයේ සමස්ත පර්යාලෝකය තුළ දුම්කොළ හා මද්‍යසාර පාලනයේ අදාළත්වය හා වැදගත්කම එයින් විද්‍යමාන වේ.

එසේම, තීරණ ගැනීමේ ක්‍රියාදාමයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස ක්‍රියාමාර්ග රැසක් හඳුන්වාදුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සහ අපගේ යෝජනා හා සැලසුම්වලට මැනවින් ප්‍රතිචාර දැක්වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගෙන් අපට නිරන්තරයෙන් ලැබෙන විශිෂ්ඨ සහයෝගිතාව සහ සහයෝගය අප සඳහන් කළ යුතුව තිබේ. මෙම ක්‍රියාදාමයේ සැබෑ පාර්ශවකරුවන් ලෙස ඔවුන්ගේ අප්‍රමාද සහයෝගය අප අධිකාරියේ කාර්යයන් සඳහා සුවිශාල පහසුවක් වී තිබේ. අමාත්‍යාංශයෙන් අපට ලැබුණු සහයෝගය අපරිමේය වන අතර එනිසාම මෙම වාර්තාවේ සඳහන් කර ඇති පරිද්දෙන්ම දුම්කොළ හා මද්‍යසාර පාලනය සඳහා මූලාරම්භයන් රැසක් හඳුන්වාදීමට අපට හැකි වී තිබේ.

තම කර්තව්‍යයන් සඵල ආකාරයෙන් ඉටු කිරීම පිණිස අධිකාරිය අනුකමිටු හතක් පත් කරනු ලැබීය. දු.ම.ජා.අ. පනත සංශෝධන අනු කමිටුව, දුම්කොළ හා මද්‍යසාර සඳහා බදුකරණ සූත්‍රයක් සකස් කිරීමේ අනුකමිටුව, දුම්කොළ හා මද්‍යසාර වැලැක්වීම හා නිවාරණ අනුකමිටුව, දුම්රහිත දුම්කොළ අනුකමිටුව, දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳව වෛද්‍ය අධ්‍යාපනය සඳහා විෂයමාලාව සකස් කිරීමේ අනුකමිටුව, දු.ම.ජා.අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීමේ ශක්තිමත් කිරීමේ අනුකමිටුව සහ දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග හඳුන්වාදීම පිණිස අනුකමිටුව එම අනුකමිටු වේ. වෛද්‍ය සංගමය, මනෝචිකිත්සක වෛද්‍ය සංගමය, මුදල් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය ආයතනය, රජරට විශ්වවිද්‍යාලය, පිළිකා මර්දන වැඩසටහන, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය සහ වයඹ විශ්වවිද්‍යාලය නියෝජනය අනුකමිටු සාමාජිකයන් හට සැබෑ පාර්ශවකරුවන් ලෙස ස්ව කැමැත්තෙන් දැක්වූ දායකත්වය හා නොමසුරු සහයෝගය වෙනුවෙන් අපගේ කෘතවේදිත්වය පලකරන්නෙමු.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු ලේකම් කාර්යාලය සමග ලෝ.සෞ.සංවිධානය අතිශයින් විශ්වාසී පාර්ශවකරුවකු වූ අතර ගෝලීය, කලාපීය සහ ජාතික මට්ටමින් අප වෙත නිරායාසයෙන් ලැබෙන සහයෝගය මිල කළ නොහැකිය. ලෝ.සෞ. සංවිධානය සහ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු ලේකම් කාර්යාලය වෙතින් අප හට ලැබෙන සම්පත් සහ තාක්ෂණික උපදෙස් අප රට තුළ දුම්කොළ පාලනය සම්බන්ධයෙන් අප ලබා ගත් ජයග්‍රහණ කෙරෙහි වැදගත් දායකත්වයක් ලබා දී තිබේ.

වඩාත්ම පිළිගැනීමට ලක්වූ සහ බොහෝ විට වඩාත්ම ඵලදායී වන්නා වූ සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමුවේ සහ අනෙකුත් විශේෂඥයන් විසින් ඒකමතිකව නිර්දේශ කරනු ලබන සාර්ථක ක්‍රියාමාර්ගයක් වනුයේ බදුකරණයයි. කේප් ටවුන් විශ්වවිද්‍යාලයේ දුම්කොළ බදුකරණය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු ලේකම් කාර්යාල දැනුම් කේන්ද්‍රය, කියු ඉන්ටනැෂනල් සමාගම සහ චිකාගෝහි ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පාසලේ ජාත්‍යන්තර විශේෂඥයන්ගේ අදහස් විමසා මෙම වසර තුළ දු.ම.ජා.අධිකාරිය දුම්කොළ සඳහා බදුකරණ සූත්‍රයක් සකස් කරනු ලැබීය.

දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් පර්යේෂණවල විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය සහතික කිරීමේ සහ දුම්කොළ හා මද්‍යසාර කර්මාන්තවල අරමුණු හා සමපාත වන අයුරින් පර්යේෂණ සිදු කිරීමට ඉඩ ලබා නොදීමේ අරමුණින් 2021 වසර තුළදී ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් ස්ථාපිත කිරීමට අධිකාරියට හැකි විය.

දුම්කොළ නිෂ්පාදන සහ මද්‍යසාර නිෂ්පාදන මගින් ඇතිවන හානිය අවම කිරීමට අදාළව රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ සංවිධාන විසින් සිදුකරනු ලබන සියලු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ ආයතනය ලෙස දු.ම.ජා.අධිකාරිය කටයුතු කරයි. අධිකාරියේ ඉලක්ක සපුරා ගැනීමේදී එල්ලවන විවිධ අභියෝග ජයගැනීමට සහාය ලබා දෙන රාජ්‍ය නොවන සංවිධානවලට අපගේ ස්තූතිය හිමි විය යුතුය.

ව්‍යුහාත්මක වශයෙන් මෙන්ම මූල්‍ය සාධ්‍යතාවය අතින්ද දු.ම.ජා.අධිකාරිය යම් ස්ථාවර තත්ත්වයකට වර්ධනය වී ඇති බැව් කිසියම් විශ්වාසයකින් යුතුව ප්‍රකාශ කිරීමට අපට හැකිය. ස්ථිර කාර්ය මණ්ඩලය සහ ව්‍යාපෘතිවලට අනුබද්ධ තාවකාලික කාර්ය මණ්ඩලය දැවැන්ත කාර්ය භාරයක් ඉටුකරන අතර වර්ධනයේ සහ සංවර්ධනයේ මීළඟ අදියර කරා අධිකාරියට ලඟා වීමට හැකි වනු

පිණිස අතිරේක කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වනු ඇත. උවමනා කරන සේවක සංඛ්‍යා අවශ්‍යතාවය සම්බන්ධයෙන් යෝජනා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ මුදල් අමාත්‍යාංශය විසින් පිළිගනු ලැබ ඇති අතර අනුමත සේවක සංඛ්‍යාවේ සියලුම තනතුරු පාහේ අධිකාරිය පුරවා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමග සහයෝගිතාවයෙන් සැලසුම් කරනු ලැබූ කාර්යයන් බොහෝමයක් සම්පූර්ණ කිරීමට අධිකාරිය සමත් වූ අතර ඒවා සාරාංශයක් ලෙස මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත. අපගේ හවුල්කරුවන්ගේ සහ පාර්ශවකරුවන්ගේ සාමුහික ප්‍රයත්නය තුළින්, දුම්කොළවලින් අප රට තුළ සිදුවන හානිය මීළඟ වසර කිහිපය තුළ මහජන සෞඛ්‍ය ගැටලුවක් නොවන මට්ටමකට තුරන් කරළීමේ ව්‍යාපාරයට නායකත්වය ලබා දීමට අපට හැකිවනු ඇතැයි යන විශ්වාසය අප සතුය. ඒ අතරම හැකි කෙටිම කාල සීමාව තුළ මද්‍යසාර පාලනය කිරීම සහ එමගින් සිදුවන හානිය පාලනය කිරීම පිණිස සියලු සහයෝගය ඒකරාශි කිරීමට සහ සියලු ක්‍රියාමාර්ග හඳුන්වා දීමට අප වඩාත් වෙහෙස මහන්සි වී කටයතු කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස දු.ම.ජා.අධිකාරිය පවුලෙන් අපට ලැබෙන විශිෂ්ඨ සහාය සහ සහයෝගය අප මෙහි ලා සඳහන් කළ යුතු අතර එම පිරිස සංඛ්‍යාවෙන් කුඩා වුවත් ඉතා සීමිත සම්පත් හා පිරිස් බලය භාවිතා කරමින් ඔවුන් ඉතා කැමැත්තෙන් සහ කිසිදු පැකිළීමකින් තොරව සුවිශාල කාර්යභාරයක් ඉටු කරයි.

## 07. දැක්ම

දුම්කොළ සහ මද්‍යසාර වලින් තොර දේශයක් සහ මහජනතාවක්

## 08. මෙහෙවර

දුම්කොළ සහ මද්‍යසාර පාදක කොට ගත් උපද්‍රවයන්ගෙන් අපගේ සමාජය නිදහස් කරගැනීම සඳහා සියලු සමාජීය අංශ ඒකරාශී කිරීම.

## 09. අරමුණු

- මහජන සෞඛ්‍ය ආරක්ෂණය සඳහා දුම්කොළ සහ මද්‍යසාර (සහ අනෙකුත් මත්ද්‍රව්‍ය) හා සම්බන්ධ පුළුල් සහ විශේෂිත ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.

- නිෂ්පාදනය, අලෙවිකරණය, ප්‍රචාරණය සහ දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය පිළිබදව ඇගයීම් සහ අධීක්ෂණය කිරීම තුළින් දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත හානි වැළැක්වීම.

- දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන වෙත ප්‍රවේශ වීමට ඇති අවස්ථා අවම කිරීමෙන් පුද්ගලයන්, විශේෂයෙන්ම ළමුන් දුම්පානයෙන් හෝ මද්‍යසාර භාවිතා කිරීම අධෛර්යමත් කරනු ලබන විධිවිධාන සැකසීම.

- සුපිරිසිදු වාතාශ්‍රය රැක ගැනීම පිළිබඳ නීති සකස් කිරීම, සම්මත කර ගැනීම, ක්‍රියාවට නැංවීම සහ ලබා ගත හැකි අවකාශ සීමා කිරීම මගින් ප්‍රජාව දුම්කොළ සහ මද්‍යසාර වලින් ආරක්ෂා කර ගැනීම.

- දුම්කොළ හා මද්‍යසාර මගින් ජනතාවට සිදු කරන හානිය වළක්වා ගැනීම සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ වැඩසටහන් හා වෙනත් උපායමාර්ග යෝජනා කිරීම හා ක්‍රියාවට නැංවීම.

# 10. කර්තව්‍ය

- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;
- ජනමාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් සහ ප්‍රජා මූලික වැඩසටහන් මගින් සෞඛ්‍ය වර්ධනය දිරි ගැන්වීම සහ සහාය වීම;
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන පරිභෝජනයෙන් උද්ගත වන හානිය අවම කර ගැනීම සඳහා උපාය මාර්ග නිර්දේශ කිරීම;
- අනීතික ඖෂධ භාවිතය වැළැක්වීම හෝ අවම කිරීම සදහා ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය විමසා වැඩපිළිවෙල් සකස් කිරීම;
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය, බදුකරණ, පරිපාලන සහ අනෙකුත් අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම;
- ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණ හා ඇගයීම් කිරීම;
- ප්‍රතිපත්තිවල ගැටලු සමීක්ෂණය කිරීම අවශ්‍ය විය හැකි පරිදි ප්‍රතිපත්තිවල යම් වෙනස්කම් ඇති කිරීමට රජයට උපදෙස් ලබාදීම;
- දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධ ගැටලු පිළබඳ පර්යේෂණ දිරිගැන්වීම සහ ඊට සහාය වීම;
- දුම්කොළ නිෂ්පාදන හ මද්‍යසාර නිෂ්පාදන සැකසීම, පරිභෝජනය හ අලෙවියට අදාළ ආර්ථික, සෞඛ්‍ය හා වෙනත් ගැටලු සමීක්ෂණය කිරීම;
- දුම්කොළ හා මද්‍යසාර පාවිච්චිය හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය;
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය රාජ්‍ය හෝ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ පෞද්ගලික අංශයේ සංවිධානවල සහභාගිත්වය ලබා ගැනීම;
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සමීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රජා සහභාගිත්වය දිරිගැන්වීම;
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ පිළිබඳ අදාළ ගැටලු පිළිබඳව මහජනයාගෙන් තොරතුරු භාරගැනීම සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අදාළ ආයතන වලට නිර්දේශ කිරීම;
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන සැකසීම හා පරිභෝජනය තුළින් උද්ගත වන හානිය අවම කිරීම සම්බන්ධයෙන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිත ආයතන හා සංවිධාන විසින් කරගෙන යන සියලු කටයුතුවල සම්බන්ධිකරණ නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීම;
- දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත සියලු විමර්ශනවල ප්‍රගතිය අධීක්ෂණ කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් දේශීය, කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණය ඇති කිරීම.

# 11. අධ්‍යක්ෂ මණ්ඩලය



**වෛද්‍ය සමාධි ඩබ්ලිව් රාජපක්ෂ මහතා**
සභාපති
දුම්කොළ හා මද්‍යසාර
පිළිබඳ ජාතික අධිකාරිය



**ආචාර්ය අජිත් රෝහණ මහතා**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය
පොලිස්පති



**වෛද්‍ය ලක්ෂ්මී සී. සෝමතුංග මිය**
අතිරේක ලේකම්
(මහජන සෞඛ්‍ය),
සෞඛ්‍ය අමාත්‍යාංශය



**එම්.ජේ. ගුණසිරි මහතා**
සුරාබදු කොමසාරිස්
ජෙනරාල්



**වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මිය**
සභාපති
අන්තරායකර ඖෂධ
පාලක මණ්ඩලය



**බී.එම්.එස්. බණ්ඩාර මිය**
අතිරේක ලේකම්
වෙළඳ අමාත්‍යාංශය



**ආර්.පී. සත්කුමාර මහතා**
අතිරේක ලේකම් (පාලන)
තොරතුරු හා ජනමාධ්‍ය
අමාත්‍යාංශය




**කමණී ගුණරත්න මිය**
අධ්‍යක්ෂ අධ්‍යාපන
(සෞඛ්‍ය හා පෝෂණ)
අධ්‍යාපන අමාත්‍යාංශය



**හිරණ්‍යා පෙරේරා මිය**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ අමාත්‍යාංශය



**සුධීර ජයරත්න මහතා**
අධ්‍යක්ෂ
ක්‍රීඩා හා තරුණ කටයුතු
අමාත්‍යාංශය




**පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි**
*ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය*
*විසින් පත්කරන ලදී.*



**සුමිත් අබේසිංහ මහතා**
*ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය*
*විසින් පත්කරන ලදී.*



**විජයානී රත්නායක මිය**
*ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය*
*විසින් පත්කරන ලදී.*



**සුනිල් ශාන්ත වීරසේකර මහතා**
*ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය*
*විසින් පත්කරන ලදී.*

# 12. 2021 වසරේ ප්‍රගතිය

(2021 ජනවාරි 1 වනදා සිට දෙසැම්බර් 31 දක්වා)

12.1 බලයලත් නිලධාරීන් විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග

| පළාත | බාලවයස්කරුවන්ට දුම්වැටි අලෙවිකිරීමේ වරද |
|---|---|
| බස්නාහිර | 6 |
| මධ්‍යම | 198 |
| දකුණ | 0 |
| ඌව | 16 |
| සබරගමුව | 31 |
| වයඹ | 12 |
| උතුරු මැද | 19 |
| උතුර | 104 |
| නැගෙනහිර | 5 |
| එකතුව | 302 |

වගුව 1 : දු.ම.ජා. අධිකාරිය පනත යටතේ සුරාබදු නිලධාරීන් විසින් පවරා ඇති නඩු

| පොලිස් කොට්ඨාශය | නඩු පැවරීම් |
|---|---|
| කැබිතිගොල්ලෑව | 21 |
| කොළඹ (දකුණ) | 1 |
| පානදුර | 14 |
| මාතර | 2 |
| තංගල්ල | 1 |
| මහනුවර | 39 |
| තෙල්දෙනිය | 23 |
| මාතලේ | 7 |
| මන්නාරම | 1 |
| කන්තලේ | 2 |
| ත්‍රිකුණාමලය | 15 |
| අම්පාර | 3 |
| කෑගල්ල | 1 |
| කුරුණෑගල | 36 |
| කුලියාපිටිය | 1 |
| මොණරාගල | 2 |
| එකතුව | 169 |

වගුව 2 : දු.ම.ජා. අධිකාරිය පනත යටතේ පොලිස් නිලධාරීන් විසින් පවරා ඇති නඩු

## 12.1.2 අධිකාරිය විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග

දුම්කොළ හා මධ්‍යසාර පිලිබද අධිකාරී පනත යටතේ අධිකාරිය විසින් නඩු 35 ක් 2021 වසරේදී පවරා ඇත.

### 12.2.1.1. කුරුළු දුම්වැටි වලට එරෙහි නඩුව

නේචර්ස් ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් ලංකා (පුද්) සමාගම "ආයුර්වේද දුම්පානය" නම් නව නිෂ්පාදනයක් හදුන්වා දුණි. සිංහල භාෂාවෙන් එහි නම සඳහන් කර තිබුණේ කුරුළු සිගරට් යනුවෙනි.

එම සමාගමට එරෙහිව දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ක්ෂණිකව ක්‍රියාමාර්ග ගනු ලැබීය. අදාළ ආයතන වෙත අප ලිපි යොමුකළ අතර මේ සම්බන්ධයෙන් ඔවුනට අවසර හිමිව ඇත්දැයි තහවුරු කර ගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් අපි සියලු තොරතුරු රැස් කළෙමු. මෙම නිෂ්පාදනය සඳහා ඔවුනට කිසිදු අවසරයක් හිමිව නොමැති බවට අධිකාරිය කරුණු සොයාගත් අතර එය සෘජුවම මහජන සෞඛ්‍යය කෙරෙහි බලපාන්නක් ද විය.

වලාන දූෂණ මර්ධන ඒකකය මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සිදු කරන ලදී. අධිකාරිය සිදුකළ එම ඒකාබද්ධ ක්‍රියාමාර්ග හේතුවෙන් අදාළ සමාගමට සියය අරමුණ ළගා කර ගත නොහැකි වූ අතර එම නිෂ්පාදනය අත්හැර දැමීමට සිදුවිය. විශේෂඥ කමිටුවකගේ සහභාගිත්වයෙන් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවක් හරහා අධිකාරිය මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කර තම මතය සමාජයට ඉදිරිපත් කරන ලදී.

### 12.2.1.2. අඛණ්ඩව සිදුකළ චිත්‍රපටි සමාලෝචනය

චිත්‍රපට පරීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂකයකු ලෙස දු.ම.ජා.අධිකාරිය ඇතුළත් කරනු ලැබීය. 2021 වසර තුළ දුම්කොළ හා මද්‍යසාර දර්ශන අඩංගු ඇතැම් සිංහල චිත්‍රපටි වලට අවසරය ලබාදීම වැළැක්වීම සඳහා බලපෑම් කිරීමට අධිකාරිය සමත් වූ අතර විදේශ චිත්‍රපට වලද දුම්කොළ හා මද්‍යසාර සහිත දර්ශන මොසෙයික මගින් ආවරණය කරන ලෙසට උපදෙස් දෙන ලදී.

### 12.2.1.3. නව මාධ්‍ය ප්‍රතිපත්තිය

චිත්‍රපටයක හෝ ටෙලිනාට්‍යයක කවර හෝ දුම්කොළ හෝ මද්‍යසාර ප්‍රචාරණය නවතාලන ලෙසට සියලු රූපවාහිණී නාලිකා සඳහා නව මාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට අධිකාරියට හැකි විය. සියලු රූපවාහිණී නාලිකා එම මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ අතර එමගින් දුම්කොළ හා මද්‍යසාරයෙන් වැළකීමේ 1948 උපකාරක දුරකථන ඇමතුම් සේවාව ද ප්‍රවර්ධනය කිරීම මගින් දැනුවත්භාවය ඉහළ නංවන ලදී. දුම්කොළ හා මද්‍යසාර දර්ශන බහුලව අඩංගු චිත්‍රපට රූපවාහිණී නාලිකා ඔස්සේ ප්‍රචාරය කිරීම නැවැත් වීමට අධිකාරියට හැකි විය.

### 12.2.1.4. සමාජ මාධ්‍ය මගින් පනත උල්ලංඝනය කිරීම

සමාජ මාධ්‍ය මගින් පනත උල්ලංඝනය කිරීම අධිකාරියට බලවත් අභියෝගයක් වූ අතර අපරාධ පරීක්ෂණ ඒකකය හා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාජ මාධ්‍ය ඒකකයේ සහයෝගිතාවයෙන් සමාජ මාධ්‍ය වල පලවූ දුම්කොළ හා මද්‍යසාර දැන්වීම් ඉවත් කිරීමට අධිකාරිය සමත් විය.මෙම උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් අධිකාරිය වාර්තා කළ විට ඒවා ඉවත් කිරීමට හා නඩු පැවරීමට බලයලත් නිලධාරින් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**12.2.1.5. "අභිෂේක" දැන්වීම් පුවරු ඉවත් කිරීම**

"අභිෂේක" වචනය සමග ප්‍රචාරය කළ කිරුළ සහිත දැන්වීම ලංකා දුම්කොළ සමාගමට අයත් බව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙන් දැන ගැනීමට අධිකාරියට හැකි විය.ඒ අනුව "අභිෂේක" වචනය හා කිරුළ සහිත දැන්වීම් පුවරු ඉවත් කරන ලෙස අධිකාරිය පළාත් සභා ලේකම්වරු මගින් උපදෙස් ලබා දුන් අතර එය සාර්ථකව ඉටු කරන ලදී.

**12.2.1.6. මාර්ගගත මද්‍යසාර අලෙවිය**

මාර්ගගතව මද්‍යසාර අලෙවි කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් වූ අවස්ථාවේ, එය දු.ම.ජා.අ. පනත සහ දැනට බලාත්මක සුරාබදු රෙගුලාසි උල්ලංඝන කිරීමක් බවට අධිකාරිය සිය අදහස ඉදිරිපත් කරන ලදී. මාර්ගගතව මද්‍යසාර අලෙවි කිරීම සඳහා මෙතෙක් අවසරය හිමිව නොමැති අතර මාර්ගගතව මද්‍යසාර අලෙවි කිරීම සඳහා ඉඩ දීමේ තීරණයට එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවක් ද ගොනු කරන ලදී.

**12.2.1.7.සුපිරි වෙළඳසල් මගින් ලබා දෙන ළැදියා ලකුණු (Loyalty Points)**

දුම්කොළ හා මද්‍යසාර මිලදී ගැනීමේදී සුපිරි වෙළඳසල් මගින් ළැදියා ලකුණු ලබා දෙන බව අධිකාරිය හඳුනා ගන්නා ලදී. එය දු.ම.ජා.අ. පනතේ 37වන වගන්තිය උල්ලංඝනය කිරීමක් බව සුපිරි වෙළඳසල් ජාලවලට දැනුම් දුන් අතර ඉන් පසුව දුම්කොළ හා මද්‍යසාර මිලදී ගැනීමේදී ළැදියා ලකුණු ලබා දීමෙන් තමන් වැළකී සිටින බව සියලු සුපිරි වෙළඳසල් ජාල මහජනතාවට දැනුම් දෙන ලදී.

**12.2.1.8. ඇතැම් පුවත්පත් මගින් පළ කරනු ලබන ලිපි**

ඇතැම් පුවත්පත් වක්‍රාකාරයෙන් දුම්කොළ හා මද්‍යසාර ප්‍රවර්ධනය කරන ලිපි පළ කළ අතරඑම පුවත් පත්වලට එරෙහිව අධිකාරිය කඩිනම් ක්‍රියාමාර්ග ගත් අතර එම පුවත්පත් ඒ සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලා තම වැරැදි නිවැරැදි කරන ලදී.

- "කල්පිටියෙන් රට වටේ යන සිංහල දුම්කොළ" යන ලිපිය සම්බන්ධයෙන්
- දු.ම.ජා.අධිකාරිය සිය වගකීම් පැහැර හැර ඇති බවට පළවූ පුවත්පත් වාර්තාව

## 12.2 අනුකමිටුවල ක්‍රියාකාරකම්

### 12.2.1 දුම්කොළ හා මද්‍යසාර වැලැක්වීම සහ නිවාරණය පිළිබඳ අනුකමිටුව

මහජනතාව තුළ තිරසර වෙනසක් ඇති කිරීම පිණිස ඉලක්ක කණ්ඩායම් සඳහා දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම සහ නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම මෙම අනුකමිටුවට පැවරී ඇති කාර්යය වේ. එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශය, ලෝක සෞඛ්‍ය සංවිධානය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකත් අදාළ අමාත්‍යාංශ සහ රජයේ ආයතන සමග සහයෝගිතාවයෙන් ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ. එම අනුකමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විතය.

<u>අනුකමිටු සාමාජිකයන්</u>

01. සභාපති - වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මිය (සභාපති, ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය)
02. සාමාජික - වෛද්‍ය සමාධි රාජපක්ෂ මයා (සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)
03. සාමාජික - වෛද්‍ය ජානකී විදානපතිරණ - (අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්ධන වැඩසටහන)
04. සාමාජික - වෛද්‍ය පුබුදු චූලසිරි මයා - (ප්‍රජා වෛද්‍ය විශේෂඥ)
05. සාමාජික - ආචාර්ය මනෝජ් ප්‍රනාන්දු (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රජරට විශ්වවිද්‍යාලය)
06. සාමාජික - වෛද්‍ය ධනුජ මහේෂ් - විශේෂඥ මනෝවෛද්‍ය
07. සාමාජික - සුධීර ජයරත්න මහතා (අධ්‍යක්ෂ - ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය)
08. කමණී ගුණරත්න මිය (අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය)





ඡායාරූප 02,03 සහ 04 : වැළැක්වීම සහ නිවාරණ අනුකමිටු රැස්වීම

### 12.2.1.1 දුම්කොල හා මද්‍යසාර පිළිබඳ මහජන මත සමීක්ෂණය

මෙම සමීක්ෂණයේ අරමුණ වනුයේ වත්මන් සහ යෝජිත මද්‍යසාර හා දුම්කොළ පිළිබඳ මහජන මතය විමසා බැලීම සහ අනාගත ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාකාරකම්වලදී සමීක්ෂණයෙන් අනාවරණය කරගත් ප්‍රධාන කරුණු උද්දේශන කාර්යයන් සඳහා යොදා ගැනීමයි. යම් නිශ්චිත මාතෘකාවක් පිළිබඳව ප්‍රජාවේ සැලකිය යුතු කොටසක් ප්‍රකාශ කරනු ලබන තනි පුද්ගල අදහස්, ආකල්ප සහ විශ්වාසයන්හි සමස්තය ලෙස මහජන මතය විස්තර කළ හැකිය. ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ කෙසේද හෝ දකිනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව විවිධ බලපෑම් ඇති කිරීමට මහජන මතයට හැකිය. දේශපාලන ක්ෂේත්‍රයේදී මහජන මතය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එය රජයේ ප්‍රතිපත්ති සඳහා මාර්ගෝපදේශ සපයයි, රාජ්‍ය ප්‍රතිපත්තියට බලපෑම් කරයි, දේශපාලනඥයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රතිපෝෂණය සපයයි, ප්‍රජාතන්ත්‍රවාදයේදී ස්වයං පාලනය ලබා දෙයි.

දුම්කොළ හා මද්‍යසාර රෙගුලාසි පිළිබඳ මහජන මත සමීක්ෂණය දුම්කොළ හා මද්‍යසාර පිළිබද ජාතික අධිකාරියේ දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම සහ නිවාරණය පිළිබඳු අනුකමිටුවේ මූලාරම්භයක් ලෙස එම අධිකාරිය විසින් 2021 වසරේදී පවත්වනු ලැබූ ජාතික මට්ටමේ සමීක්ෂණයකි.

ප්‍රතිචාරිකයන්ගේ පසුබිම් ගතිලක්ෂණ, දුම්කොළ හා මද්‍යසාර භාවිතය, දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදන මාධ්‍ය මගින් සෘජුව හෝ වක්‍රව ප්‍රවර්ධනය, දුම්කොළ හා මද්‍යසාර පාලනය පිළිබඳ වත්මන් හා යෝජිත රෙගුලාසි පිළිබඳ මහජන මතය සහ තෝරාගත් ප්‍රධාන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ දැනුම මෙම සමීක්ෂණයට ඇතුළත් විය.

2021 වසරේ සිදුකළ මෙම සමීක්ෂණයේ නියැදියේ ප්‍රමාණය 1027ක් වූ අතර ඒ සඳහා තෝරාගනු ලැබූයේ වයස අවුරුදු 15ට වැඩි තැනැත්තන්ය. විශේෂඥ කමිටුවක් විසින් සකස් කරනු ලැබූ පූර්ව පරීක්ෂිත ස්වයං පරිපාලිත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් සමීක්ෂණය සිදුකරන ලදී. දත්ත රැස්කිරීම සඳහා ලේඛනමය මෙන්ම මාර්ගගත වේදිකා යොදා ගන්නා ලදී. සමීක්ෂණ ප්‍රතිඵල ඇතුළත් දත්ත පත්‍රිකා දෙකක් සහ පොත් පිංචක් සකස් කරන ලදී.

### 12.2.1.2 දුම්කොළ හා මද්‍යසාර රෙගුලාසි පිළිබඳ මහජන මත සමීක්ෂණය පිළිබඳ පුවත්පත් සාකච්ඡාව

දුම්කොළ හා මද්‍යසාර රෙගුලාසි පිළිබඳ මහජන මත සමීක්ෂණය දුම්කොළ හා මද්‍යසාර පිළිබද ජාතික අධිකාරියේ දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම සහ නිවාරණය පිළිබඳු අනුකමිටුවේ මූලාරම්භයක් ලෙස එම අධිකාරිය විසින් 2021 වසරේදී පවත්වනු ලැබූ ජාතික මට්ටමේ සමීක්ෂණයකි. මෙම සමීක්ෂණයේ අරමුණ වනුයේ වත්මන් සහ යෝජිත මද්‍යසාර හා දුම්කොළ පිළිබඳ මහජන මතය විමසා බැලීම සහ අනාගත ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාකාරකම් වලදී සමීක්ෂණයෙන් අනාවරණය කරගත් ප්‍රධාන කරුණු උද්දේශන කාර්යයන් සඳහා යොදා ගැනීමයි.

සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, මාධ්‍යවේදීන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය, ජාතික පිළිකා මර්ධන වැඩසටහන, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය සහ හෙල්දි ලංකා සංවිධානය යන අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් 2021 නොවැම්බර් 12 වන දින පුවත්පත් සාකච්ඡාවක් පවත්වන ලදී.

එම පුවත්පත් සාකච්ඡාවේදී සමීක්ෂණ ප්‍රතිඵල ඇතුළත් දත්ත පත්‍රිකා දෙකක් සහ පොත් පිංචක් නිකුත් කරන ලදී.









**ඡායාරූප 05, 06 සහ 07 : දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ මහජන මත සමීක්ෂණය පිළිබඳ පුවත්පත් සාකච්ඡාව**

### 12.2.1.3 දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම හා නිවාරණය පිළිබඳ සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලාව

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පවත්වනු ලැබූ දුම්කොළ හා මද්‍යසාර වැලැක්වීම හා නිවාරණය පිළිබඳ උපදේශන සහතිකපත්‍ර පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2021 නොවැම්බර් 03 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ලැවෙන්ඩර් සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබීය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා එහි ප්‍රධාන ආරාධිතයා විය. දු.ම.ජා.අධිකාරියේ සභාපති වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා සහ අධිකාරියේ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, සහතික පත්‍ර පාඨමාලාවේ පීඨ සාමාජිකයන් සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයන් එම අවස්ථාවයට සහභාගි විය.

ශ්‍රී ලංකා පොලීසිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තරුණ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරීන් සහ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ පාඨමාලාව හැදෑරුවන් සඳහා එහිදී සහතිකපත්‍ර පිරිනමන ලදී.

දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳව විශේෂ පුහුණුවක් ලැබූ මෙම සහතිකපත්‍ර ලාභීන් සතියේ දින හත තුළ පැය 24 පුරා ක්‍රියාත්මක 1948 උපදේශන දුරකථන සේවාව තවදුරටත් ශක්තිමත් කරමින් ඊට අඛණ්ඩව දායක වනු ඇත.








**ජායාරූප 08,09 සහ 10 : දුම්කොළ හා මද්‍යසාර වැළැක්වීම හා නිවාරණය පිළිබඳ උපදේශන සහතිකපත්‍ර පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය**

**12.2.1.4 ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවත්වනු ලැබූ දුරකථන උපදේශනය පිළිබඳ අතථ්‍ය පුහුණු වැඩමුළුව**

මෙම වැඩමුළුව සඳහා ලෝ.සෞ. සංවිධානයේ විශේෂඥයන් වූ ආචාර්ය ඩොංබෝ ෆු, මහාචාර්ය ස්මිතා දෙෂ්පන්දේ සහ මහාචාර්ය සොනාලි අරෝරා සහභාගී විය. වැඩමුළුවේ දින තුන තුළ දිනකට ආසන්න වශයෙන් සහභාගිකයන් 80 දෙනෙකු සම්බන්ධ විය. අධිකාරියේ ආරාධනයෙන් ආයතන කිහිපයක් වැඩමුළුව හා සම්බන්ධ වී කටයුතු කරන ලදී. එම ආයතන නම් ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය, ජාතික තරුණ සේනාංකය, අනුරාධපුර ශික්ෂණ රෝහල සහ රජරට විශ්වවිද්‍යාලයයි. අධිකාරිය විසින් පවත්වනු ලැබූ උපදේශන පාඨමාලාවට සහභාගිවූවන් ද මේ සඳහා සහභාගි විය.

**12.2.1.5 : 1948 දුරකථන උපදේශන සේවාව පිළිබඳ තොරතුරු**

දුම්කොළ හා මද්‍යසාර භාවිතා කරන්නන්ට දුම්කොළ හා මද්‍යසාර භාවිතයෙන් මිදීමට අවස්ථාව උදාකර දීම පිණිස දු.ම.ජා.අධිකාරිය විසින් 1948 මනෝ උපදේශන සේවාව දියත් කරනු ලැබීය.

මෙම දුරකථන උපදේශන සේවාවේ අරමුණ වන්නේ දුම්කොළ හා මද්‍යසාර භාවිතයෙන් මිදීම සහ දුම්කොළ හා මද්‍යසාර භාවිතයට අදාළ ගැටලු සඳහා නොමිලේ සේවා සැපයීමයි.

පහත දැක්වෙන වගුවෙන් (වගුව 01) 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මෙම අංකයට ලැබුණු ඇමතුම් පිළිබඳ විස්තර ඇතුළත් වේ. ඇමතුම් විස්තරවලට අනුව, උපදේශනය පතා ලැබුණු ඇමතුම්වල සැලකියයුතු වැඩිවීමක් අගෝස්තු මාසයේදී දක්නට ලැබේ එම වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලසීමාව තුළ වැඩිම ඇමතුම් ලැබී තිබුණේ අගෝස්තු මාසයේදීය.

**වගුව 01**

| මාසය | මුළු ඇමතුම් සංඛ්‍යාව | උපදේශන ඇමතුම් සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 190 | 30 |
| පෙබරවාරි | 181 | 47 |
| මාර්තු | 275 | 32 |
| අප්‍රේල් | 41 | 12 |
| මැයි | 102 | 01 |
| ජුනි | 257 | 13 |
| ජුලි | 247 | 26 |
| අගෝස්තු | 2500 | 734 |
| සැප්තැම්බර් | 1482 | 640 |
| ඔක්තෝබර් | 897 | 485 |
| නොවැම්බර් | 1660 | 554 |
| දෙසැම්බර් | 1193 | 223 |
| එකතුව | 9025 | 2797 |

### 12.2.2 දුම්කොළ හා මද්‍යසාර සඳහා බදුකරණ සූත්‍රය සකස් කිරීමේ අනුකමිටුව

මෙම අනුකමිටුවේ අරමුණ වනුයේ දුම්කොළ හා මද්‍යසාර සඳහා සරල, පාරදෘශ්‍ය බදුකරණ සූත්‍රයක් සකස් කිරීමයි. මෙ අරමුණ සපුරා ගනු වස් ජාතික මට්ටමේ ක්‍රියාදාමයක් ක්‍රියාවට නංවා තිබේ. මෙම බදුකරණ සූත්‍රය සකස් කිරීම පිණිස ලෝක සෞඛ්‍ය සංවිධානය, මුදල් අමාත්‍යාංශය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වැනි රාජ්‍ය නොවන සංවිධාන අනෙකුත් අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමග සහයෝගීතාවයෙන් කටයුතු කරමින් සිටියි.

<u>**අනුකමිටු සාමාජිකයන්**</u>

01. සභාපති - වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා - ( සභාපති, දු.ම.ජා.අ.)
02. සාමාජික - ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා - (අධ්‍යක්ෂ ජනරාල්, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව)
03. සාමාජික - මහාචාර්ය කේ. අම්ර්තලිංගම් මහතා - (ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
04. සාමාජික - වෛද්‍ය එම්.ඩී.කේ ද සිල්වා මහතා - (ප්‍රධානී, සෞඛ්‍ය මානව සම්පත් අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය)

*ආරාධිතයකු ලෙස* :
හරිනි වීරසේකර මිය - පර්යේෂණ ආර්ථික විද්‍යාඥ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව





**ජායාරූප 11,12 සහ 13 : දුම්කොළ හා මද්‍යසාර සඳහා බදුකරණ සූත්‍රය සකස් කිරීමේ අනුකමිටුව**

අනුකමිටුව මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

**12.2.2.1 සෞඛ්‍ය විශේෂඥයන් සහ අදාළ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමග උද්දේශන රැස්වීම**

දුම්කොළ සඳහා බදුකරණ සූත්‍රයක් සකස් කිරීම පිණිස අනුකමිටුවක් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 2020 අප්‍රේල් මාසයේදී, දුම්කොළ සඳහා අනුකමිටුවක් පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමතිය හිමි වුණි. විෂය පිළිබඳ ප්‍රවීණයන් අනුකමිටු සාමාජිකයන් ලෙස පත්කරනු ලැබූ අතර ශ්‍රී ලංකාව සඳහා දුම්කොළ බදු දර්ශකයක් සකස් කිරීම ඔවුනට පැවරුණි.

විෂය පිළිබඳ විශේෂඥයන් සහ අදාළ පාර්ශවකරුවන් සමග අදහස් විමසීමේ පවත්වනු ලැබීය. රැස්වීම් සෙත්සිරිපාය කාර්යාල සංකීර්ණයේ ශ්‍රවණාගාරයේ පැවත්වූ අතර ඒ සඳහා 30 දෙනෙකු පමණ සහභාගි විය. අධිකාරියේ අනුකමිටුවේ විශේෂඥ කමිටු සාමාජිකයන් සමග පැවැත්වූ සාකච්ඡා වට කිහිපයකින් පසුව, බදුකරණ දර්ශක සූත්‍රයක් / ප්‍රතිපත්ති යෝජනාවක් සකස් කරන අතරතුර කේප් ටවුන් විශ්වවිද්‍යාලයේ දුම්කොළ බදුකරණය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු ලේකම් කාර්යාල දැනුම් කේන්ද්‍රය, කියු ඉන්ටනැෂනල් සමාගම සහ චිකාගෝහි ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය පාසලේ ජාත්‍යන්තර විශේෂඥයන්ගේ සහ ලෝ.සෞ.සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමුව-2030 ශ්‍රී ලංකාව සඳහා සම්බන්ධීකාරකගේ අදහස් විමසන ලදී. සකස් කරන ලද බදුකරණ මොඩියුලයේ ප්‍රතිලාභ සහ එහි අවශ්‍යතාවය සම්බන්ධයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II හි 11 වන මහලේ ශ්‍රවණාගාරයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්, ප්‍රධාන පාර්ශවකරුවන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමග රැස්වීමක් පවත්වන ලදී.







**ඡායාරූප 14,15 සහ 16 : සෞඛ්‍ය විශේෂඥයන් සහ අදාළ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමග උද්දේශන රැස්වීම**

### 12.2.2.2 දුම්කොළ බදුකරණය පිළිබඳ ලෝ.සෞ.සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු දැනුම් කේන්ද්‍රය හා අනීතික වෙළඳාම පිළිබඳ අතථ්‍ය වැඩමුළුව


මෙම වැඩමුළුව සඳහා සහභාගිවූ රටවල් වූයේ එල් සැල්වදෝරය, සුරිනෑම්, සවුදි අරාබිය, කෙන්යාව, මොසැම්බික්, සැම්බියාව සහ ශ්‍රී ලංකාවයි. දුම්කොළ බදුකරණය හා අනීතික වෙළඳාම පිළිබඳ දැනුම් කේන්ද්‍රය, ලෝ.සෞ.සං. දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමුව සහ කේප් ටවුන් විශ්වවිද්‍යාලයේ බදු අය කළ හැකි නිෂ්පාදන පිළිබඳ ආර්ථික විද්‍යාව පිළිබඳ පර්යේෂණ ඒකකය මගින් බදුකරණ දර්ශක සූත්‍රය වෙනස් කිරීම සහ දුම්කොළ බදු හා මිල දර්ශක සංසන්දකය වෙනස් කිරීම පිණිස TETSiM ආකෘතිය හඳුන්වා දීම සඳහා මාර්ගෝපදේශ ලබා ගන්නා ලදී.

### 12.2.2.3. දුම්කොළ බදුකරණ සූත්‍රයේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය සාකච්ඡාව

සංවර්ධිත දුම්කොළ බදුකරණ මොඩියුලයක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡාව 2021 දෙසැම්බර් 30 දින පැවැත්විණි. මාධ්‍යවේදීන් එකසිය පහළොවක් මාධ්‍ය හමුවට සහභාගී වූ අතර ඔවුන් මාධ්‍ය හමුවට සක්‍රීයව සම්බන්ධ වූහ. උත්සවයෙන් පසු අලුතින් සංවර්ධනය කරන ලද බදුකරණ මොඩියුලය සම්බන්ධයෙන් පුවත්පත් මගින් තවත් ලිපි පළ විය.







**ඡායාරූප 17, 18 සහ 19 : දුම්කොළ බදුකරණය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව**

### 12.2.3 අනුකමිටුව - දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග හඳුන්වාදීමේ අනුකමිටුව

මෙම අනුකමිටුවේ කාර්යය වන්නේ ශ්‍රී ලංකාවෙන් දුම්කොළ වගාව තුරන් කොට දුම්කොළ ගොවීන්ට විකල්ප ජීවනෝපාය හඳුන්වා දීමයි. මෙම අරමුණ සපුරා ගැනීමේ අරමුණින් සෞඛ්‍ය අමාත්‍යාංශය, ලෝක සෞඛ්‍ය සංවිධානය, කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල අනෙකුත් අදාළ අමාත්‍යාංශ සහ රජයේ ආයතන සමග සහයෝගිතාවයෙන් ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ.

එම අනුකමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විතය.

- වෛද්‍ය ලක්ෂ්මී සී. සෝමතුංග මිය - කමිටු සභාපති/ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය), සෞඛ්‍ය අමාත්‍යාංශය
- ආර්.පී. සත්කුමාර මහතා - අතිරේක ලේකම්, තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ දු.ම.ජා.අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- පී.සී. පීරිස් මහතා - අධ්‍යක්ෂ, කෘෂි තාක්ෂණවේද අංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය
- ඩබ්.ආර්. ඩබ්. එම්.එස්.එන්.පී. වීරකෝන් මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම (ව්‍යාප්ති), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ඉංජිනේරු විජයානි රත්නායක මිය - දු.ම.ජා.අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර මහතා - පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- මහාචාර්ය එච්.එල්.ටී. වීරහේවා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය







**ඡායාරූප 20, 21 සහ 22 : දුම්කොළ වගාව සඳහා විකල්ප බෝග හඳුන්වාදීමේ අනුකමිටුවේ රැස්වීම**

අනුකම්පුව මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

**12.2.3.1: නියමු ව්‍යාපෘතියක් තුළින් තිරසර දුම්කොළ වගාවෙන් තොර දිස්ත්‍රික්ක ඇති කිරීම**

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලනය පිළිබඳ ප්‍රඥප්ති රාමුව, දුම්කොළ වගාව කෙරෙහි මූලිකවම අදාළ වන්නා වූ එහි 17 සහ 18 වගන්ති මගින් පාරිසරික ප්‍රවේදිතාවන් ආමන්ත්‍රණය කරයි. පසුගිය දශක කිහිපය තුළ දුම්කොළ වගාව ඉහළ ආදායම් රටවල සිට අඩු ආදායම් රටවල් දක්වා ක්‍රමිකව විතැන්වීමක් දක්නට ලැබෙන අතර එමගින් බහුජාතික දුම්කොළ සමාගම්වලට වඩා අඩු මුදලකට ක්‍ෂුම සම්පත් වෙත ප්‍රවේශය ලබා ගනිමින් තම නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමට අවස්ථාව සැලසී ඇත. වඩා අඩු මිලට ශ්‍රමය ලබා ගනිමින් තම නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීමට ශ්‍රී ලංකාව බහුජාතික සමාගම්වලට ඉඩ ලබා දී තිබේ. දුම්කොළ වගා කිරීම සඳහා ඉතා උචිත තත්ත්වයන් ශ්‍රී ලංකාවේ පවතින අතර දුම්කොළ සමාගම් විසින් බීජ සහ කෘෂි රසායන ලබාදීම මගින් මැදිහත්වීම් සිදුකර ගොවීන්ගේ අස්වැන්න ඉහළ මිලකට ලබා ගැනීම හේතු කොට ගෙන ශ්‍රී ලංකාව තුළ දුම්කොළ වගාව ව්‍යාපත් වී තිබේ. එහිදී ඇතැම් ගොවීන්ට කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභ හිමිවුවද, තවත් බොහෝ දෙනෙකුට දිගු කාලීන සමාජ, ආර්ථික, සෞඛ්‍ය සහ පාරිසරික ගැටලුවලට මුහුණ පෑමට සිදුවනු ඇත.

2015.07.07 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයක් ප්‍රකාරව ජනාධිපති කාර්ය සාධක හමුදාවේ ව්‍යාපෘතියක් ලෙස 2017-2018 වසර වලදී දුම්කොළ වගාව වෙනුවට විකල්ප ජීවනෝපාය ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලදී. ඉහත ව්‍යාපෘතියත් සමගින්, දුම්කොළ වගාව සඳහා යොදාගත් හෙක්ටයාර 664ක වෙනත් භෝග වගාකරනු ලැබීය. එම ව්‍යාපෘතිය පොලොන්නරුව, කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ අතර ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව යාපනය, මාතලේ, මහනුවර, පුත්තලම සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල දුම්කොළ වගාව ව්‍යාප්තව වෙමින් පවතී.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනුයේ දුම්කොළ ගොවීන් ආර්ථික වශයෙන් ලාබදායි වෙනත් විකල්පයන්හි නිරත කර වීමට වන අතර මොණරාගල හා අනුරාධපුර මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වා ගැනීම පිණිස දුම්කොළ ගොවීන් සඳහා විකල්ප ජීවනෝපාය වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

මෙම වැඩසටහන ක්‍රියාකාරකම් හතරක් ලෙස සිදුකරන ලදී. ආරම්භක අදියරේ දී තෝරා ගත් දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන්, කෘෂි ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන්, දුම්කොළ මඩු හිමිකරුවන්, සිවිල් සමාජ සාමාජිකයන් සහ ගොවි පවුල් සඳහා මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහාය ඇති උද්දේශණ වැඩසටහන් පැවැත්වීමට නියමිත අතර රජයේ නිලධාරීන් හරහා ගොවීන්ගේ තොරතුරු ලබා ගැනීම මගින් දුම්කොළ වගාව පිළිබඳ තත්ත්ව විශ්ලේෂණයක් සිදු කරනු ඇත.

මොණරාගල පැවැත්වූ වැඩසටහනේදී දුම්කොළ ගොවීන් දුම්කොළ වගාවෙන් ඉවත්වීමවළක්වාලන ප්‍රධාන සාධක හඳුනාගනු ලැබීය. මොණරාගල පැවැති නියමු වැඩසටහනේදී දුම්කොළ ගොවීන් ඇතුළුව ගොවීන් 125 දෙනෙකු ආමන්ත්‍රණය  කළ අතර බිම් මට්ටමේ කෘෂි ක්ෂෙත්‍ර නිලධාරීන් 75 දෙනෙකු සංවේදී කරන ලදී. මොණරාගල දිස්ත්‍රික්කයේ ඉහළ මට්ටමේ නිලධාරීන් දැනුවත් කළ අතර ගොවීන්ගේ ගැටලු සම්බන්ධයෙන් ඵලදායී සාකච්ඡාවක් පවත්වන ලදී.

අනුරාධපුර පැවැත්වූ වැඩසටහනේදී දුම්කොළ ගොවීන් දුම්කොළ වගාවෙන් ඉවත්වීම වළක්වාලන ප්‍රධාන සාධක හඳුනාගනු ලැබීය. අනුරාධපුර පැවැති නියමු වැඩසටහනේදී දුම්කොළ ගොවීන් ඇතුළුව ගොවීන් 150 දෙනෙකු ආමන්ත්‍රණය  කළ අතර බිම් මට්ටමේ කෘෂි ක්ෂේත්‍ර නිලධාරීන් 100 දෙනෙකු සංවේදී කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉහළ මට්ටමේ නිලධාරීන් දැනුවත් කළ අතර ගොවීන්ගේ ගැටලු සම්බන්ධයෙන් ඵලදායී සාකච්ඡාවක් පවත්වන ලදී.









**ඡායාරූප 23, 24, 25 සහ 26 : ගොවීන් සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති උද්දේශන වැඩසටහන**









**ඡායාරූප 27, 28, 29 සහ 30 : ගොවීන් සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ පැවති උද්දේශන වැඩසටහන**







**ඡායාරූප 31, 32 සහ 33 : නිලධාරීන් සඳහා සංවේදීතා වැඩසටහන, අනුරාධපුරය**







**ඡායාරූප 34, 35 සහ 36 : නිලධාරීන් සඳහා සංවේදීතා වැඩසටහන, මොණරාගල**







**ඡායාරූප 37, 38 සහ 39 : පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන, අනුරාධපුරය**







**ඡායාරූප 40, 41 සහ 42 : පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන, මොණරාගල**

### 12.2.4 දුම්රහිත දුම්කොළ අනුකමිටුව

දු.ම.ජා.අධිකාරියේ දුම්රහිත දුම්කොළ අනුකමිටුව 2020 වසරේදී පිහිටවනු ලැබූ අතර 2021 වසර තුළද දුම්රහිත දුම්කොළ මගින් ඇතිවන හානිය තුරන් කරලීම පිණිස කටයුතු කරන ලදී. ජාත්‍යන්තර සහ ජාතික ආයතනවල සහාය ඇතිව 2021 වසර තුළදී අනුකමිටුව පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීය.

- දුම්රහිත දුම්කොළ ආශ්‍රිත"බුලත් විටට සැබෑ අරුතක්" නම් විද්‍යාත්මකසඟරාව නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සමග ඒකාබද්ධව මුඛ සෞඛ්‍ය වැඩි දියුණු කළ හැකි ඖෂධීය නිෂ්පාදනයක් වන "සංස්ථා බුලත් සැපේ" හඳුන්වා දෙන ලදී.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයේ සහයෝගයෙන් මුඛ පිළිකාවේ සැබෑ හානිය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ජාත්‍යන්තර හා ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන්ට කරුණු දැක්වීම පිණිස අධ්‍යාපනික වීඩියෝ පටයක් සකස් කරන ලදී.

<u>අනුකමිටු සාමාජිකයන්</u>

01. වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා - සභාපති, දු.ම.ජා.අ..
02. ආර්.පී. සත්කුමාර මහතා - අතිරේක ලේකම් (පාලන), තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
03. එස්.එස්. වීරසේකර මහතා - දු.ම.ජා.අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04. මහාචාර්ය කමල් පෙරේරා මහතා- මහාචාර්ය, දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
05. මහාචාර්ය නදීන ජයසූරිය මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ මුඛ හා හණුක ශල්‍ය වෛද්‍ය, දන්ත විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
06. වෛද්‍ය මේධානි හේවාගම මිය - මනෝ වෛද්‍ය විශේෂඥ
07. වෛද්‍ය සංජීවනී රූපසිංහ මිය - ඇස, කණ, නාසය පිළිබඳ විශේෂඥ ශල්‍ය වෛද්‍ය
08. වෛද්‍ය සචිනී රස්නායක - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ පිළිකා රෝග විශේෂඥ, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය







**ඡායාරූප 43, 44 සහ 45 : දුම් රහිත දුම්කොළ නිවාරණය පිළිබඳ අනුකමිටුව**

අනුකම්ටුව මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකරයි.

### 12.2.4.1 දුම්රහිත දුම්කොළ ආශ්‍රිත "බුලත් විටට සැබෑ අරුතක්" නම් විද්‍යාත්මක සඟරාව සහ ආයුර්වේද ඖෂධීය නිෂ්පාදනයක් වන "සංස්ථා බුලත් සැපේ" දියත් කිරීම

දුම්රහිත දුම්කොළ මගින් සිදුවන හානිය රටින් තුරන් කිරීමේ අරමුණින් සකස් කළ බුලත් විට සඳහා ආදේශකයක් හඳුන්වාදීමේ උත්සවයක් දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සංවිධානය කරන ලදී. දුම්රහිත දුම්කොළ භාවිතය සෘජුවම මුඛ පිළිකාව සඳහා හේතු කාරක වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ මුඛ පිළිකා රෝගීන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. එබැවින්, මුඛ සෞඛ්‍යය වැඩි දියුණු කළ හැකි ආයුර්වේද නිෂ්පාදනයක් සකස් කිරීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම දුම්රහිත දුම්කොළ අනුකම්ටුව තීරණය කරන ලදී. එම නිෂ්පාදනය සමග "බුලත් විටට සැබෑ අරුතක්" නම් විද්‍යාත්මක සඟරාව ප්‍රකාශයට පත්කරන ලදී.

මෙහි අරමුණු වූයේ සකස් කරන ලද නිෂ්පාදනය දියත් කළ අතර ඒ සඳහා අදාළ මාධ්‍ය අවධානය යොමු කරන ලදී, දුම්රහිත දුම්කොළවල සැබෑ හානිය පිළිබඳව මහජනතාව දැනුවත් කරන ලදී, දුම්රහිත දුම්කොළ ආශ්‍රිත විද්‍යාත්මක දත්ත සහ තොරතුරු සහ එයින් සිදුවන හානිය පිළිබඳ තොරතුරු රැස්කරන ලදී.

මෙම වැඩසටහන 2021 මාර්තු 26 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ ලෝටස් ශාලාවේදී පස්වරු 2.00 සිට 5.00 දක්වා පවත්වන ලදී. ගරු සෞඛ්‍ය අමාත්‍ය නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය ප්‍රධාන අමුත්තා ලෙස මෙම අවස්ථාවට එක් වූ අතර ගරු රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මහතා ද ඊට සහභාගි විය.

මෙම උත්සවයේදී, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සමග සහයෝගිතාවයෙන් අධිකාරිය විසින් සකස් කරනු ලැබූ"සංස්ථා බුලත් සැපේ" නම් ආයුර්වේද වෛද්‍ය නිෂ්පාදනය දියත් කරන ලදී. බුලත් විටේ ඉතිහාසය, සෞඛ්‍ය බලපෑම සහ සම්ප්‍රදාය පිළිබඳ කරුණු අන්තර්ගත පළමු විද්‍යාත්මක සඟරාව වූ "බුලත් විටට සැබෑ අරුතක්" දියත් කර ඒ සම්බන්ධයෙන් මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කළ අතර එම දියත් කිරීමේ උත්සවය රූපවාහිණී නාලිකා කිහිපයක් සිය ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ මගින් ප්‍රචාරය කරන ලදී.












ඡායාරූප 46, 47, 48, 49, 50 සහ 51 - උත්සවයේ ආරම්භය









ඡායාරූප 52, 53, 54, 55, 56 සහ 57 - ප්‍රධාන කථිකයන් සභාව අමතමින්









ඡායාරූප 58, 59, 60, 61, 62 සහ 63 : උත්සවයේ විශේෂ අවස්ථා

### 12.2.5 අනුකමිටුව - දුම්කොළ හා මද්‍යසාර පිලිබද ජාතික අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීම

දු.ම.ජා.අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීම පිණිස නව අනුකමිටුවක් පිහිටුවන ලදී. අනුකමිටුව විසින් දුම්කොළ නිෂ්පාදන ඇසිරුම් වල ඇති රූපමය සෞඛ්‍ය අවවාද කිරීම් වෙනස් කරන ලදී. විශේෂඥයන්ගේ අදහස් හා යෝජනා මත පදනම්ව ඡායාරූප දහයක් තෝරා ගන්නා ලද අතර එම නව ඡායාරූප ලංකා දුම්කොළ සමාගම වෙත යොමු කරන ලදී.

මොසෙයික ක්‍රමය යොදා ගන්නා ලෙස සියලු මාධ්‍ය ආයතන වලට නැවත නිර්දේශ ලබා දෙන ලදී. රූපවාහිණී නාලිකා මගින් විකාශනය කරනු ලබන චිත්‍රපටි හා ටෙලිනාට්‍ය ඇතුළුව වැඩසටහන් වල දුම්වැටි හා මද්‍යසාර භාවිතා කරන දර්ශන අඩංගු වේ නම් ඒවා ආවරණය කිරීම පිණිස මොසෙයික ක්‍රමය යොදා ගන්නා ලෙස උපදෙස් ලබා දී එය ක්‍රියාත්මක කරන ලදී.

“දු.ම.ජා.අ. මාධ්‍ය උල්ලංඝනය කිරීම් යෙදුම” නම් ජංගම දුරකථන යෙදුමක් දියත් කිරීමට දු.ම.ජා.අධිකාරිය සැලසුම් කරන ලදී. එහි ප්‍රධාන අරමුණ වන්නේ කවර හෝ සන්නිවේදන ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදන ප්‍රවර්ධනය කරන ඕනෑම අනීතික ක්‍රියාකාරකමක් හඳුනා ගැනීමට සහ ඊට එරෙහිව ක්‍රියා මාර්ග ගැනීමයි. ඒ අනුව, මෙම ජංගම යෙදුම නිර්මාණය කර 2021.12.29 දින දියත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණයේ කේන්ද්‍ර ස්ථානය ලෙස, ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාගේ අනුග්‍රහය යටතේ රටේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණය උදෙසා දායකත්වය ලබාදුන් මාධ්‍යවේදීන් ඇගයීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් සඳහා උද්දේශණ වැඩසටහනක් අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබීය. මෙම වැඩසටහනේදී දුම්කොළ හා මද්‍යසාර නිවාරණය වෙනුවෙන් දැක්වූ දායකත්වය වෙනුවෙන් මාධ්‍යවේදීනි ඇගයීමට ලක් කොට දිරිමත් කරන ලදී. දුම්කොළ හා මද්‍යසාර නිවාරණය උදෙසා මාධ්‍යවේදීන් සහ පාර්ශවකරුවන් දැනුවත් කිරීම පිණිස මෙම වැඩසටහන මනා පිටුවහලක් විය.

<u>අනුකමිටුවේ සාමාජිකයන්</u>

01. වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා - සභාපති, දු.ම.ජා.අ.
02. වෛද්‍ය ලක්ෂ්මී සෝමතුංග මිය - අතිරේක ලේකම්, මහජන සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අමාත්‍යාංශය
03. ආර්.පී. සත්කුමාර මහතා - අතිරේක ලේකම් (පාලන), තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
04. මහාචාර්ය දියනාත් සමරසිංහ මහතා - වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය
05. වෛද්‍ය මහේෂ් රාජසූරිය මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මනෝ චිකිත්සා අධ්‍යනාංශ, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
06. වෛද්‍ය ධනුජ මහේෂ් මහතා - මනෝ වෛද්‍ය විශේෂඥ
07. වෛද්‍ය වෙනුර පලිහවඩන මහතා - මනෝ වෛද්‍ය විශේෂඥ
08. ආචාර්ය චාමර විජේසිංහ මහතා - කථිකාචාර්ය, වෛද්‍ය පීඨය කැළණිය විශ්වවිද්‍යාලය
09. ආචාර්ය අමිල ඉසුරු මහතා - මනෝ වෛද්‍ය විශේෂඥ සහ මනෝ චිකිත්සාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨය, රජරට විශ්වවිද්‍යාලය
10. අධිකරණ මනෝ වෛද්‍ය සුසිත් මෙන්ඩිස් මහතා - වෝහාරික මනෝ වෛද්‍ය විශේෂඥ
11. වෛද්‍ය මේධානි හේවාගම මිය - මනෝ වෛද්‍ය විශේෂඥ




ඡායාරූප 64 සහ 65 : දු.ම.ජා.අ. මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීමේ හා ශක්තිමත් කිරීමේ අනුකම්ටුව

**12.2.5.1. මාධ්‍ය සම්මාන උළෙල - 2021 (මාධ්‍යවේදීන් හා මාධ්‍ය නාලිකා ඇගයීමේ වැඩසටහන)**

ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මද්‍යසාර නිවාරනය කිරීමේ කේන්ද්‍රස්ථානය වන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා ඔවුන් දක්වන දායකත්වය අගය කිරීමේ අරමුණින් ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන් සඳහා උද්දේශන වැඩසටහනක් සංවිධානය කළේය.

මෙම වැඩසටහන 2021 දෙසැම්බර් 29 (බදාදා සවස 5.30 සිට 8.00 දක්වා බත්තරමුල්ල දියත හෝටලයේදී පැවැත්විණි. ගරු සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා (පා.ම.) ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී විය.

දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා මාධ්‍යවේදීන්ගේ දායකත්වය අගය කිරීම, දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා මාධ්‍යවේදීන් දිරිමත් කිරීම සහ පාර්ශවකරුවන් දුම්කොළ හා මද්‍යසාර නිවාරණය සදහා උද්දේශනය කිරීම.

ඩිජිටල් මාධ්‍ය නාලිකා අටක් (සියත රූපවාහිනය, සිරස රූපවාහිනිය, දෙරණ රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, ජාතික රූපවාහිනිය, ස්වර්ණවාහිනිය, හිරු රූපවාහිනී නාලිකාව, ශ්‍රද්ධා රූපවාහිනිය) සම්මානයට පාත්‍ර වූ අතර විශේෂ සම්මානය “සියත **TV** හි පියුම් විල” වෙත හිමි විය. මුද්‍රිත මාධ්‍යවේදීන් තිදෙනෙකු (Daily News ඉංග්‍රීසි පුවත්පත සඳහා ආනන්ද කන්නන්ගර මහතා, “අද” පුවත්පතේ නිසංසලා නදීශානි පතිරණ මහත්මිය සහ Vidyal.lk දෙමළ E පත්‍රය සඳහා රිෆ්ති අලි මහතා) සහ ගුවන් විදුලි නාලිකා තුනකින් "SLBC" , V Fm  සහ ලක් හඬ ගුවන් විදුලි නාලිකාව) සහ දුම්කොළ සහ මද්‍යසාර නිවාර්ණය සඳහා ඔවුන් දැක්වූ දායකත්වය වෙනුවෙන් V Fm හි “විදුල ළමා ගුවන්විදුලිය” වැඩසටහනට විශේෂ සම්මානය පිරිනමන ලදී.

පනතේ බලයලත් නිලධාරියාගේ ජංගම යෙදුම 2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ (සංශෝධිත පරිදි) බලයලත් නිලධාරීන් විසින් උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් ගොනු කර ඇති නඩු පිළිබඳ තොරතුරු සැපයීමේ ප්‍රධාන වේදිකාව වේ. තවද  හට මෙම යෙදුම හරහා ඔවුන්ගේ සේවාව සෘජුවම අධීක්ෂණය කිරීමට සහ ඇගයීමට හැකිය. VNATA මාධ්‍ය උල්ලංඝනය ජංගම යෙදුම දුම්කොළ සහ මද්‍යසාර නීති විරෝධී ක්‍රියාකාරකම් හඳුනා ගැනීමයි. ඒ අනුව, සියලුම මාධ්‍ය හරහා සිදුවන උල්ලංඝනයන් මෙහිදී හඳුනාගත යුතු අතර විශේෂයෙන්ම හ්ඕ හට මෙම යෙදුම හරහා අලුතින් දත්ත නිරීක්ෂණය කළ හැක.

මෙම උත්සවය දුම්කොළ සහ මධ්‍යසාර නිවාරණ ක්‍රියාකාරකම් සමඟ ඵලදායී ලෙස මාධ්‍ය අංශය ඒකාබද්ධ කරයි. මාධ්‍ය අංශයේ ඉහළ නිලධාරීන් වෙනුවෙන් පෙනී සිටීම වැදගත්. සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍ය අංශය විසින් සිදු කරනු ලබන NATA පනතේ උල්ලංඝනය කිරීම් නිරීක්ෂණය කිරීමට වේදිකාවක් සකස් කිරීම සහ මෙම සම්මාන උළෙල වාර්ෂිකව පැවැත්වීම සුදුසුය.





ඡායාරූප 66 සහ 67 : වැඩසටහනේ විශේෂ අවස්ථා

### 12.2.6 අනුකමිටුව - රූපමය සෞඛ්‍ය අවවාද කිරීම්

"දු.ම.ජා.අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීම" නම් අනුකමිටුවක් අධිකාරිය විසින් ස්ථාපිත කරනු ලැබීය. ඒ අනුව, මෙම අනුකමිටුව හරහා දුම්වැටි ඇසුරුම් වල රූපමය සෞඛ්‍ය අවවාද කිරීම් සම්බන්ධයෙන් අධිකාරිය දැවැන්ත පියවරක් ගන්නා ලදී. එකී අනුකමිටුවේ තීරණය ප්‍රකාරව, නව රූපමය සෞඛ්‍ය අවවාද කිරීම් හඳුන්වා දෙන ලදී. නව රූපමය අවවාද කිරීම් පෙළක් අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීමේ හා ශක්තිමත් කිරීමේ අනුකමිටුවේ විශේෂඥ මඩුල්ලක් විසින් තෝරා ගන්නා ලදී. තවද, බංගලාදේශයේ හා තායිලන්තයේ රූපමය අවවාදකිරීම්වල යොදා ගැනීමට අවසර ඉල්ලා අධිකාරිය ඉල්ලීම් ලිපි යොමු කළ අතර රටවල් දෙකම ඒ සඳහා අවසරය ප්‍රදානය කරන ලදී.

කෙසේ වෙතත්, විශේෂඥ මඩුල්ල රැස්කළ ඡායාරූප පෙළක් මගින් අධිකාරිය නව රූපමය සෞඛ්‍ය අවවාද කිරීම් පොළක් හඳුන්වා දෙන ලද අතර ඒ අනුව මේ වන විට තමන්ටම පමණක් අයත් රූපමය සෞඛ්‍ය අවවාද කිරීමේ පෙළක් අධිකාරිය සතුය.

එම පින්තූර පෙළ දු.ම.ජා.අධිකාරිය සංයුක්ත තැටියකට අන්තර්ගත කොට ලංකා දුම්කොළ සමාගම වෙත යොමු කරන ලදී. නව සිගරට් ඇසුරුම් සඳහා නව රූපමය සෞඛ්‍ය අවවාද කිරීම් පෙළ යොදා ගන්නා ලෙස එකී ලියුම මගින් අධිකාරිය සමාගමට උපදෙස් දෙන ලදී.

ලිපි කිහිපයක් හුවමාරු කරගැනීමෙන් පසුව රූපමය සෞඛ්‍ය අවවාද කිරීම් අධිකාරිය නිකුත් කිරීම පිළිබඳව ලංකා දුම්කොළ සමාගම නෛතික විරෝධයක් මතු කර ඇති අතර ඒ අනුව අධිකාරිය මෙම කරුණ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය විමසා ඇත.

### 12.2.7 අනුකමිටුව වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සඳහා දුම්කොළ මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ විෂය මාලාවක් සංවිධානය කිරීම.

ශ්‍රී ලංකාවේ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ලෙස දුම්කොළ මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත රෝග ප්‍රතිකාර නිවාරණය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ තරුණ වෛද්‍යවරුන්ගේ කුසලතා සහ දැනුම පදනම යාවත්කාලීන විය යුතු බව NATA ආයතනයේ අදහසයි. තවද, වර්තමාන ගෝලීය රෝග බර සමඟ විෂය මාලා නොගැලපීම හේතුවෙන් මෙම අංශ කෙරෙහි අසමාන ලෙස අඩු අවධාරණයක් පවතී.

එබැවින්, දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ අනාගත වෛද්‍ය උපාධි අපේක්ෂකයින්ගේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා ''වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ විෂයමාලා සංවර්ධනය - අනුකමිටුව'' NATA මණ්ඩලයේ අනුමැතිය ඇතිව, දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ විෂය මාලාව සංවර්ධනය කිරීම සහ සංවර්ධනය කරන ලද විෂය මාලාව ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය වෛද්‍ය පීඨ වල ක්‍රියාත්මක කිරීමේ අරමුණින් පත් කරන ලදී. තවද, මෙම අනු කමිටුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෛද්‍ය පීඨවල මහාචාර්යවරුන්, වෛද්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ කථිකාචාර්යවරුන් වැනි ගෞරවනීය ශාස්ත්‍රාලිකයන්ගෙ සහභාගිත්වයෙන් ආරම්භ විය. ඒ අනුව පළමු කමිටු රැස්වීම 2021 මාර්තු 04 වන දින පැවැත්වුණේ කමිටුවේ සභාපතිවරයා ලෙස NATA සභාපතිවරයා ඇතුළු කමිටු සාමාජිකයින් 9 දෙනෙකුගේ සහභාගිත්වයෙන්ය. මේ දක්වා ශ්‍රී ලංකාවේ රාජ්‍ය වෛද්‍ය පීඨ දහයක් ආවරණය වන පරිදි කමිටු සාමාජිකයින් 14 දෙනෙකුගෙන් යුක්තව කමිටුව වැඩිදියුණු කර ඇත.

01. සභාපති - ආචාර්ය වෛද්‍ය සමාධි රාජපක්ෂ (සභාපති, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)
2. සාමාජික - සුනිල් ශාන්ත වීරසේකර මහතා (මණ්ඩල සාමාජික, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)
3. සාමාජික - ආචාර්ය බී. ආර්. චාන්දනී මෙන්ඩිස් (සාමාන්‍යාධිකාරී, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)
4. සාමාජික - මහාචාර්ය අසේල ඔලුපෙරියව (මහාචාර්ය, වෛද්‍ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
5. සාමාජික - වෛද්‍ය මහේෂ් රාජසූරිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මනෝ වෛද්‍ය අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)
6. සාමාජික - වෛද්‍ය සිසිර ධර්මරත්න (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)
7. සාමාජික - වෛද්‍ය වාසනා ජයරත්න (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය අධ්‍යාපන ඒකකය, වෛද්‍ය හා අනුබද්ධ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය)
8. සාමාජික - වෛද්‍ය මනුජා පෙරේරා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මහජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය)

9. සාමාජික - වෛද්‍ය ජයමාල් ද සිල්වා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මනෝ වෛද්‍ය අංශය, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

10. සාමාජික - වෛද්‍ය බී. කුමාරේන්ද්‍රන් (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ප්‍රජා සහ පවුල් වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය)

11. සාමාජික - ආචාර්ය කේ.ඩී.සී.ඒ. බානගල (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යුහ විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය)

12. සාමාජික - ආචාර්ය ඒ.ආර්.එම්. සනූස් (කථිකාචාර්ය, සායනික විද්‍යා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව)

13. සාමාජික - වෛද්‍ය අයි.එල්.ඒ.එන්. දර්ශන (කථිකාචාර්ය, ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය)

14. සාමාජික - වෛද්‍ය අසංක වීරියාව (කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය)

## 12.3 අනෙකුත් වැඩසටහන්

### 12.3.1 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය - 2021

දුම්කොළ විරෝධී මාධ්‍ය ව්‍යාපාරයක් සමග "අත්හැර දැමීමට කැපවෙමු" යන තේමාව යටතේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය - 2021 (NSTAP 2021) දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් පවත්වනු ලැබීය. මෙම මූලාරම්භය 2021 ලෝක දුම්කොළ විරෝධී තේමාව සෘජුවම ආමන්ත්‍රණය කරයි. ශ්‍රී ලංකාවේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණයේ කේන්ද්‍රස්ථානය ලෙස, ශ්‍රී ලංකාව තුළ දුම්කොළ හා මද්‍යසාර පාලනය ශක්තිමත් කිරීම පිණිස වූ මෙම මූලාරම්භය ක්‍රියාත්මක කිරීම මගින් ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ව්‍යාපෘතිය දු.ම.ජා.අධිකාරිය ක්‍රියාවට නංවා තිබේ.

මෙම සම්මන්ත්‍රණයේ අරමුණු වනුයේ දුම්කොළ නිසා සිදුවන හානිය පිළිබඳ යථාර්තය සම්බන්ධයෙන් විද්‍යාත්මක සාක්ෂි ජනතාව අතර ප්‍රචලිත කිරීම, දුම්කොළවලින් ඉවත්වීමට දුම්පානය කරන්නන්ට සහායවීම පිණිස සමාජ හා සම්ප්‍රදායික යන දෙයාකාර මාධ්‍ය ඔස්සේ ප්‍රචාරක ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම සහ දුම්කොළ ආශ්‍රිත පර්යේෂණවල නිරත වීමට පර්යේෂකයන් අතර උද්යෝගය ඉහළ නැංවීමයි.

මෙම සම්මන්ත්‍රණය බත්තරමුල්ලේ වෝටර්ස් එජ් හෝටලයේදී 2021 නොවැම්බර් 26 වනදා පෙ.ව. 8.00 සිට ප.ව. 5.30 දක්වා අනු තේමා හයක් යටතේ සැසි දෙකක් ලෙස පවත්වන ලදී. ඒවානම්:-

1. දුම්කොළ හා මද්‍යසාර භාවිතය වැලැක්වීම හා නිවාරණය
2. දුම්කොළ හා මද්‍යසාර පරිභෝජනයේ ආර්ථික බලපෑම
3. පාරිසරික තිරසරභාවය සහ දුම්කොළ හා මද්‍යසාර පරිභෝජනය
4. දුම්කොළ හා මද්‍යසාර වල සමාජ විද්‍යාත්මත බලපෑම
5. දුම්කොළ හා මද්‍යසාර පරිභෝජනය සෞඛ්‍ය කෙරෙහි බලපෑම
6. දුම්කොළ හා මද්‍යසාර භාවිතයට අදාළ නෛතික කරුණු


මෙම විද්‍යාත්මක සම්මන්ත්‍රණයේදී මතු වූ කරුණු ක්‍රියාත්මක කිරීම පිණිස විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවන ලදී. අනතුරුව, දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය-2021 පැවැත්වීම පිණිස ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබීය. මේ සඳහා සංක්ෂිප්තා වාර්ථාව කැඳවීමේ කාල සීමාව අවසාන වන විට, සංක්ෂිප්තා 40ක් ඒවායේ විස්තෘත වාර්තා සමග අධිකාරියට ලැබී තිබුණි.

එම සංක්ෂිප්ත සමාලෝචනය කිරීමෙන් පසුව, සම්මන්ත්‍රණයේදී ප්‍රකාශයට පත්කිරීම පිණිස සංක්ෂිප්ත වාර්ථාව විසි අටක් (28) ක් තෝරා ගන්නා ලදී. වාචික ඉදිරිපත් කිරීම් සඳහා සංක්ෂිප්ත වාර්ථාව විස්සක් තෝරා ගත් අතර පෝස්ටර් ඉදිරිපත් කිරීම් සඳහා සංක්ෂිප්ත අටක් තෝරා ගන්නා ලදී.

සම්මන්ත්‍රණයට සහභාගි වූවන් සහ අදාළ අධ්‍යාපනික ආයතන අතර බෙදා හැරීම පිණිස සංක්ෂිප්ත වාර්ථා තුන්සීයක් මුද්‍රණය කරනු ලැබිය. සහභාගිකයන් සහ ජයග්‍රාහකයන් අතර බෙදා හැරීම පිණිස අදාළ ද්‍රව්‍ය (සමරු, හැඳනුම් පත්, පෝස්ටර, සහතික පත්‍ර සහ පදක්කම්) සකස් කරන ලදී.

ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබූ දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය දුම්කොළ හා මද්‍යසාර නිවාරණය ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීමට තරුණ පර්යේෂකයන් අතර උද්යෝගය ඉහළ නංවන ලදී.

දුම්කොළ භාවිතයෙන් මිදීමට දුම්කොළ භාවිතා කරන්නන් සවිබල ගැන්වීම ඔවුනගේ ජීවිතයට සෑම ආකාරයකින්ම හිතකර වනු ඇත. එය ඔවුන්ගේ ජීවිතයේ ගුණාත්මකභාවය මෙන්ම ඔවුන්ගේ පවුලේ තත්ත්වය නංවාලීමට උපකාර වනු ඇත. විද්‍යාත්මක සාක්ෂි පැවැතීම ශක්තිමත් කිරීම සැම විටම වැදගත් වේ.





**ඡායාරූප 68, 69 සහ 70 : දුම්කොළ හා මද්‍යසාර නිවාර්ණය පිලිබඳ ජාතික සම්මන්ත්‍රණය 2021 හි විශේෂ අවස්ථා**

### 12.3.2. පාසල් පෙළපොත් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය ආශ්‍රිත සෞඛ්‍ය පණිවිඩ සකස් කිරීම පිණිස විශේෂ කමිටුවක් පත්කිරීම

දුම්කොළ හා මද්‍යසාරවලින් ළමුන් ආරක්ෂා කරගැනීම 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබද ජාතික අධිකාරිය පනත මගින් එහි පූර්විකාවේ කොටසක් ලෙස හඳුනා ගෙන ඇත. තම ආර්ථික ස්ථාවරභාවය පවත්වා ගැනීම පිණිස නව පාරිභෝගිකයන් ග්‍රහණය කර ගැනීමේ අඛණ්ඩ ක්‍රියාදාමයක දුම්කොළ හා මද්‍යසාර කර්මාන්ත නිරතව සිටින බැවින් දුම්කොළ හා මද්‍යසාර නිෂ්පාදන භාවිතය සඳහා එම කර්මාන්ත ළමුන් කෙරෙහි බලපෑම් ඇතිකරන බව විද්‍යාත්මත සාක්ෂි මගින් පෙන්නුම් කරයි. එවැනි බලපෑම් වලට නිරාවරණය වන ළමුන්ට එම ද්‍රව්‍යය භාවිතය සිත් ගන්නා සුළු හා ආකර්ෂණීය දෙයක් බවට පත්වන අතර එමගින් දුම් පානය සහ මත්පැන් පානය සඳහා ළමුන්ගේ කැමැත්ත වැඩි වනු ඇත. එබැවින්, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳව ළමුන්ගේ ආකල්ප කෙරෙහි බලපෑම් කිරීමේ අරමුණින් සහ ඒවා කෙරෙහි ඔවුන් ආකර්ෂණ කර ගැනීමට දුම්කොළ හා මද්‍යසාර කර්මාන්ත විවිධ උපක්‍රම යොදා ගනිමින් ළමුන් අතර සාවද්‍ය හා නොමග යවන සුළු තොරතුරු පතුරුවා හරින බව ඉතා පැහැදිළිය.

ඒ අනුව, ශ්‍රී ලංකාව ඇතුළුව විවිධ රට වලින් ලබාගත් සාක්ෂි මගින් තහවුරු වනුයේ නොමග යවන සුළු තොරතුරු මගින් මීළඟ පරම්පරාව තමන්ට වාසිදායක ලෙස හසුරුවා ගැනීම මගින් මෙම කර්මාන්ත සෑජුවම ඔවුන් ඉලක්ක කරන බවයි. එබැවින් කඩිනම් හා සඵල ක්‍රියාමාර්ග මගින් ඊට එරෙහිව ක්‍රියාත්මක වීමට මහජන සෞඛ්‍ය තීරණය කරන්නන් සූදානම්ව සිටිය යුතුය. ඒ අනුව, සවිබල ගන්වනු ලැබීමෙන් මෙම කර්මාන්ත වල බලපෑම මර්ධනය කිරීම පිණිස නිවැරැදි තොරතුරු වෙත ප්‍රවේශ වීම, අපගේ තරුණ පරම්පරාවේ අයිතිය බව අප අධිකාරිය දැඩිව විශ්වාස කරයි.

සන්නිවේදනය ධනාත්මක සෞඛ්‍ය ප්‍රතිඵල සපුරා ගැනීම පිණිස වන කවර හෝ ප්‍රයත්නයක අවශ්‍ය සංරචකයක් බැවින්, මෙම අයිතිය සහතික කිරීම පිණිස ළමුන් සමග සඵල, ඒකාබද්ධ සහ සමායෝජිත සන්නිවේදනය අත්‍යාවශ්‍ය බව දු.ම.ජා.අ. පිළිගනියි. තවද, තම සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම පිණිස ක්‍රියා මාර්ග ගැනීමට ජනතාව බල ගන්වන හා ක්‍රියා මාර්ග ගන්නා ආකාරයකින් නිවැරැදි සෞඛ්‍ය තොරතුරු සැපයීම අතිශයින් වැදගත්ය.

එබැවින්, පාසල් පෙළපොත්වල අන්තර්ගත කිරීම පිණිස දුම්කොළ හා මද්‍යසාර නිවාරණය ආශ්‍රිත සෞඛ්‍ය පණිවුඩ සකස් කිරීම පිණිස සාමාජිකයන් 9 දෙනෙකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් අධිකාරිය විසින් ස්ථාපිත කරනු ලැබීය.

- ආචාර්ය වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා (සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)
- කමණී ගුණරත්න මිය (අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය)
- වෛද්‍ය රංජිත් බටුවන්තුඩාව මහතා(අධ්‍යක්ෂ, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය)
- වෛද්‍ය ජානකී විදානපතිරණ මිය (අධ්‍යක්ෂ, ජාතික පිළිකා පාලන වැඩසටහන)
- වෛද්‍ය වින්ධ්‍යා කුමාරපේළි මිය (අධ්‍යක්ෂ, බෝ නොවන රෝග ඒකකය,, සෞඛ්‍ය අමාත්‍යාංශය)
- වෛද්‍ය දුලාංගී දහනායක මිය (මනෝ විද්‍යා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය/ ළමා හා යෞවන මනෝ චිකිත්සා විශේෂඥ වෛද්‍ය)
- වෛද්‍ය මේධානි හේවාගම මිය (මනෝ වෛද්‍ය විශේෂඥ)
- ආචාර්ය නදී අමා ජයසේකර මිය (ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ,  ජාතික අධ්‍යාපන ආයතනය)
- නදී අමා ජයසේකර මිය (විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ,  ජාතික අධ්‍යාපන ආයතනය)
- හංසමාලී වික්‍රමසූරිය මිය (පර්යේෂණ නිලධාරී, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය)

දුම්කොළ හා මද්‍යසාර භාවිතයට එරෙහිව ක්‍රියාකිරීම සඳහා මීළඟ පරම්පරාව දැනුවත් කිරීම හා දිරිමත් කිරීම අරමුණු කරමින් මෙම විද්වත් කමිටුව දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ සෞඛ්‍ය පණිවුඩ පෙළක් සකස් කරන ලදී. සඵලතාව ඉහළ නංවනු පිණිස මෙම සෞඛ්‍ය පණිවිඩ ළමුන්ගේ වයසට යෝග්‍ය ආකාරයෙන් ළමා හා තරුණ පිරිසට උචිත භාෂාවකින් සකස් කරනු ලැබීය. එම සෞඛ්‍ය පණිවුඩ සකස් කිරීමෙන් පසුව ඒවා දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තන කර පාසල් පෙළපොත් වල මුද්‍රණය කිරීම පිණිස අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට  ඉදිරිපත් කරන ලදී. මෙම මූලාරම්භයේ ප්‍රතිඵලයක් ලෙස, තෝරාගත් එක් සෞඛ්‍ය පණිවිඩයක් 10 වසර සිංහල මාධ්‍ය විද්‍යාව පෙළ පොතේ සහ 11 වසර දෙමළ මාධ්‍ය විද්‍යා පෙළපොතේ 2021 වසරේදී පළ කරන ලදී.

### 12.3.3 දු.ම.ජා.අධිකාරියේ අචාර ධර්ම සමාලෝචන කමිටුවක් ස්ථාපිත කිරීම

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබද ජාතික අධිකාරිය පනත යටතේ ස්ථාපති කරනු ලැබූ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ශ්‍රී ලංකාව තුළ දුම්කොළ හා මද්‍යසාර පාලනය පිළිබඳ කේන්ද්‍රස්ථානය වේ.

පනත විසින් බලාත්මක කරන ලද විධිවිධාන මග හැර යමින් තම මාරාන්තික නිෂ්පාදන පාරිභෝජනය ඉහළ නැංවීම මගින් තම ලාභ වැඩි කර ගැනීමට  දුම්කොළ හා මද්‍යසාර කර්මාන්ත සැම විටම උත්සාහ දරයි. ඒ සඳහා ඔවුන් උපාය මාර්ග ගණනාවක් යොදා ගනියි. එවැනි එක් ප්‍රධාන උපායමාර්ගයක් වනුයේ ව්‍යාජ  පර්යේෂණ සඳහා අරමුදල් සපයා ඊනියා විද්‍යාත්මක නිබන්ධන හරහා සාවද්‍ය හා නොමග යවන සුළු තොරතුරු ප්‍රචාරණය කිරීමයි.

ඒ අනුව, දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් පර්යේෂණවල විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය සහතික කිරීමේ සහ දුම්කොළ හා මද්‍යසාර කර්මාන්ත වල අරමුණු හා සමපාත වන අයුරින් පර්යේෂණ සිදු කිරීමට ඉඩ ලබා නොදීමේ අරමුණින් 2021 දෙසැම්බර් 29 වන දින ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් ස්ථාපිත කිරීමට අධිකාරියට හැකි විය.

එම කමිටුවේ සාමාජිකයන් ලෙස පහත දැක්වෙන විද්වතුන් පත්කරන ලදී.

1. කමිටු සභාපති - රුවන් සත්කුමාර මහතා, අතිරේක ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය, දු.ම.ජා.අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
2. ලේකම් - විරාජ් බණ්ඩාරනායක මහතා, නීති නිලධාරි, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
3. විජයානි රත්නායක මිය,දු.ම.ජා.අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4. වෛද්‍ය ජනකී විදානපතිරන, අධ්‍යක්ෂ, ප්‍රතිපත්ති විශ්ලේෂනය සහ  සංවර්ධනය, සෞඛය අමත්‍යනංශය
5. මහාචාර්ය දිලිප් ද සිල්වා මහතා, ප්‍රධාන මහාචාර්ය, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
6. මහාචාර්ය කමල් පෙරේරා මහතා, දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
7. මහාචාර්ය නදීන ජයසුරිය මහතා, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
8. මහාචාර්ය මනෝරි සේනානායක මිය, ළමා රෝග අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
9. මහාචාර්ය චන්ද්‍රාණි ලියනගේ මිය, සමාජ විද්‍යා මහාචාර්ය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
10. මහාචාර්ය සී.එස්.වීරරත්න මහතා, රජරට විශ්වවිදයාලයේ සහ රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය
11. ආචාර්ය ආර්. හනීෆා මහතා, ප්‍රධානී, පවුල් සෞඛ්‍ය අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
12. ආචාර්ය කුසුමලතා ලංකාමුල්ල මිය, ප්‍රධානී, සිංහල සහ ජන සන්නිවේදන අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
13. වෛද්‍ය අමිල ඉසුරු මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය, රජරට විශ්වවිද්‍යාලය

14. වෛද්‍ය මේධානි හේවාගම මිය, මනෝ වෛද්‍ය විශේෂඥ
15. වෛද්‍ය එන්. ජෙයකුමාරන්, සායනික පිළිකා රෝග විශේෂඥ, අපේක්ෂා රෝහළ, මහරගම
16. ආචාර්ය බී කුමරේන්ද්‍රන් , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
17. වෛද්‍ය එස්.එම්. හෙට්ටිආරච්චි මයා, ශ්වසන රෝග පිළිබඳ ජාතික රෝහල, වැලිසර
18. ආචාර්ය රංග පෙරේරා මහතා,පිළිකාවේද ශල්‍ය වෛද්‍ය විශේෂඥ/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
19. වෛද්‍ය ශ්‍රීනිකා ද සිල්වා වැලිඅංග මිය, ප්‍රජා වෛද්‍ය/ වෛද්‍ය සංඛ්‍යාලේඛනඥ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය, වෛද්‍ය පීඨය, කොලඹ විශ්වවිද්‍යාලය
20. ආචාර්ය නිශාන්ත කුමාරසිංහ,මහතා චර්යා විද්‍යාඥ/සායනික වෛද්‍ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
21. ආචාර්ය සෙව්වන්දි සුභසිංහ මිය, ඖෂධවේද අධ්‍යනාංශය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය
22. ශාක්‍ය නානායක්කාර මහතා, නීතිඥ
23. නදී අමා ජයසේකර මිය, ජ්‍යේෂ්ඨ අධ්‍යනාංශය, ජාතික අධ්‍යපන ආයතනය
24. කමනී හෙට්ටියාරච්චි මිය, ව්‍යාවසායක

# 13. අධිකාරියට නව කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම


කාර්ය මණ්ඩලයේ පහත ඇබෑර්තු පිරවීම පිණිස කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය කඩිනම් පියවර ගන්නා ලදී.

## 13.1. සාමාන්‍යාධිකාරී බදවා ගැනීම



ඡායාරූප 71 : සාමාන්‍යාධිකාරී සම්මුඛ පරීක්ෂණය

## 13.2. සංවර්ධන නිලධාරී බඳවා ගැනීම



ඡායාරූප 72 : සංවර්ධන නිලධාරී පත්වීම් ප්‍රදානය කිරීම.

# 14. මූල්‍ය ප්‍රගතිය (2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)

## 14.1. මූල්‍ය ප්‍රකාශන

### දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
### මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
### 2021 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2021 | 2020 |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ | 16 | 11.901,780.33 | 13.154,942.28 |
| අස්පෘශ්‍ය වත්කම් | 18 | 8,567,995.49 | 3,400,510.25 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 19 | 46.638.92 | 31,694.01 |
| ලැබිය යුතු දෑ | 26 | - | - |
| පූර්ව ගෙවීම් | 28 | 50,000.00 | 50,000.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | 20 | 1,198,009.00 | 5,710,772.82 |
| මුළු වත්කම් | | **21,764,423.74** | **22,347,919.36** |
| බැරකම් | | | |
| **ජංගම බැරකම්** | | | |
| උපචිත වියදම් | 21 | 500,892.01 | 271,584.19 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 22 | 4,368,000.00 | 4,777,165.00 |
| පොදු තැන්පතු | 23 | - | - |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 22 | 687,157.50 | - |
| **මුළු බැරකම්** | | **5,556,049.51** | - |
| **මුළු ශුද්ධ වත්කම්** | | **16,208,374.23** | **17,299,170.17** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධ** | | | |
| ප්‍රාග්ධනය | 24 | 6,560,893.26 | 6,560,893.26 |
| රජයේ ප්‍රදානය- ප්‍රාග්ධනය | 25 | 19,206,567.21 | 17,371,578.41 |
| සමුච්චිත අතිරික්ත/ (හිඟය) | 29 | (9,961,479.56) | (6,633,301.51) |
| පෙර වසරේ ගැලපීම් | 27 | - | - |
| ප්‍රාග්ධන ලාභ | 33 | 402,393.32 | |
| | | **16,208,374.23** | **17,299,170.17** |

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසිනු අනුමත කරනු ලැබ ඔවුන් වෙනුවෙන් අත්සන් කරනු ලැබ ඇත.

| | | |
|---|---|---|
| .............................. | .................................. | .............................. |
| වෛද්‍ය සමාධි රාජපක්ෂ<br>සභාපති | අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |

..............................
අනුෂිකා කෝරළගේ
ගණකාධිකාරී

## දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
## මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | සටහන | 2021 | 2020 |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ආදායම</u> | | රු. | රු. |
| රජයේ ප්‍රදානය - පුනරාවර්තන | 9 | 22,883,000.00 | 20,135,500.00 |
| ආදායම - ප්‍රාග්ධන ප්‍රතිපූරණය | 31 | 8,218,725.00 | 2,258,142.01 |
| අනෙකුත් ආදායම (සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමෙන් ලැබුණු ආපසු නොගෙවනු ලබන මුදල් ) | 23 | - | 450.00 |
| ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය | 30 | 2,583,951.20 | 2,859,140.14 |
| **මුළු ආදායම** | | **33,685,676.20** | **25,253,232.15** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක වැටුප් | 10 | 13,478,536.51 | 8,306,567.51 |
| සැපයුම් හා භාවිතා කළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 11 | 423,987.49 | 228,110.69 |
| නඩත්තුව | 12 | 506,886.06 | 381,749.39 |
| ගිවිසුම්කර සේවා | 13 | 11,056,849.53 | 10,462,043.42 |
| ක්ෂයවීම හා ක්‍රමක්ෂය | 14 | 2,583,951.19 | 2,859,140.14 |
| වැඩසටහන් සඳහා වියදම | 32 | 7,152,584.64 | 4,345,985.96 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **35,202,795.42** | **26,583,597.11** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය)** | | **(1,517,119.22)** | **(1,330,364.96)** |
| <u>මූල්‍ය පිරිවැය</u> | | | |
| බැංකු ගාස්තු | 15 | 6,300.00 | 6,855.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ අතිරික්තය/ (හිඟය)** | | **(1,523,419.22)** | **(1,337,219.96)** |

## දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | සටහන | 2021 | 2020 | |
|---|---|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ</u>** | | රු | රු | |
| | | . | ප්‍රකාශිත | නැවත ප්‍රකාශිත |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය) | | (1,523,419.22) | (1,337,219.96) | (1,337,219.96) |
| **ගැලපීම්:** | | | | |
| උපචිත වියදම් ගැලපීම | | (2,960,000.00) | 56,350.25 | (3,327,650.00) |
| ක්ෂය කිරීම් ගැලපුම | 29 | 1,155,241.16 | - | - |
| **කාරක ප්‍රාග්ධන ශාස්තුවලට පෙර මෙහෙයුම් ලාභය** | | **(3,328,178.06)** | **(1,280,869.71)** | **(4,664,809.96)** |
| ක්ෂයවීමේ වැඩිවීම/ (අඩුවීම) | 14 | 2,583,951.19 | 2,859,140.14 | 2,859,140.14 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය | 30 | (2,583,951.19) | (2,859,140.14) | (2,859,140.14) |
| තොග (වැඩිවීම)/අඩුවීම | 19 | (14,944.91) | (10,037.69) | (10,037.69) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | 26 | - | - | - |
| පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 28 | - | (266.00) | (266.00) |
| තැන්පතු (වැඩිවීම)/අඩුවීම | 23 | - | (275,223.02) | - |
| උපචිතවීම් (වැඩිවීම)/අඩුවීම | 21 | 229,307.82 | (378,934.26) | (378,934.26) |
| සේවක පිරිවැටය අදාළ ප්‍රතිපාදනවල (වැඩිවීම)/අඩුවීම | 22 | 853,992.50 | 1,112,337.00 | 4,496,337.00 |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | | **(2,259,822.65)** | **(812,386.30)** | **(537,163.53)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(2,259,822.65)** | **(812,386.30)** | **(537,163.53)** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ</u>** | | | | |
| පිරියත හා උපකරණ අත්කර ගැනුම | 16.1 | (103,960.00) | (57,395.00) | (57,395.00) |
| අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනුම | 18.1 | (4,314,980.00) | - | - |
| ඉවත් කළ හැකි ස්ථාවර වත්කම් ලාභ/(අලාභ) | 33 | (84,175.85) | - | - |
| ප්‍රාග්ධන ප්‍රතිපූරණය (රජයේ ප්‍රදානය) | 25 | 2,525,290.00 | 332,618.02 | (57,395.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(1,977,825.85)** | **275,223.02** | - |
| | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (4,237,648.50) | (537,163.28) | (537,163.28) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | | 1,712,497.48 | 824,128.08 | 824,128.08 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (විදේශ අරමුදල්) | 20 | 3,723,160.02 | 5,423,808.02 | 5,423,808.02 |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | 1,198,009.00 | **5,710,772.82** | **5,710,772.82** |

## දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
## ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය
## 2021 දෙසැම්බර් 31 දිනට

| | 2021 |
|---|---|
| | රු. |
| **2021.01.01 දිනට දු.ම.ජා.අ. අරමුදල** | **17,299,170.17** |
| පෙර වර්ෂවලට අදාළ ගැලපීම් | (1,804,758.84) |
| පෙර වර්ෂ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | - |
| **2021.01.01 දිනට ගැලපූ ශේෂය** | **15,494,411.33** |
| ප්‍රාග්ධන ප්‍රතිපූරණය | 4,418,940.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (2,583,951.20) |
| ප්‍රාග්ධන ලාභ | 402,393.32 |
| කාලසීමාව සඳහා ගැලපීම | - |
| වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය) | (1,523,419.22) |
| **2021.12.31 දිනට ශේෂය** | **16,208,374.23** |

## දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

### 14.2. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2021 දෙසැම්බර් 31න් අවසන් වසර

### 1. පිළියෙල කිරීමේ පදනම

### 1.1 අනුකූලතා ප්‍රකාශනය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය (ශ්‍රී.ල.ව.ග.අ.) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිළියෙල කර ඇත.

### 1.2 කෘත්‍යාංත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය මත පිළියෙල කර ඇති අතර ශ්‍රී ලංකා රුපියල්වලින් (රු.) ඉදිරිපත්කර ඇත.

### 1.3 රජයේ ප්‍රදාන

මණ්ඩලය දෙවර්ගයක රජයේ ප්‍රදාන ලබයි, එනම්-

- ප්‍රාග්ධන ප්‍රදාන
- පුනරාවර්තන ප්‍රදාන

ප්‍රාග්ධන ප්‍රදාන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් ගත කොට ඇත. එම ක්‍රමයේදී ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් සේ සලකා ඇති අතර එය මූලිකවම වත්කම්වල ප්‍රයොජ්‍ය ආයුකාලය මත පිළිගෙන ඇත. (උදා: වත්කම්වල වාර්ෂිකව ක්ෂයවන වටිනාකම වර්ෂය සඳහා ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇත.)
පුනරාවර්තන ප්‍රදානය අදාළ කාල සීමාවේ ආදායම ලෙස පිළිගෙන ඇති අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට බැර කර තිබේ.

### 2. වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

### 2.1 දේපළ, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද යම් වියදම් සමගින් අත්කර ගැනුමේ හෝ ඉදිකිරීමේ පිරිවැය වේ.

වත්කම් භාවිතයට ගත හැකි දිනයේ සිට අපහරණය කරන දිනය දක්වා ක්ෂයවීම සපයා ඇත. පිරියත හා උපකරණ පහත දැක්වෙන පරිදි සරල රේඛීය ක්‍රමය මත ක්ෂය කරනු ලැබේ. තවද, දේපළ, පිරියත හා උපකරණ ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 7 - දේපළ, පිරියත හා උපකරණ හි නිර්දේශ කර ඇති පරිදි පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමවේදයට ගිණුම් ගත කොට ඇත.

ප්‍රධාන වාර්ෂික අනුපාත පහත පරිදි භාවිතා කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා සවිකිරීම් | වසර 25 (4%) |

| | |
|---|---|
| යන්ත්‍රෝපකරණ හා උපකරණ | වසර 10 (10%) |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | වසර 10 (10%) |
| පරිගණක | වසර 5 (20%) |
| වාහන | වසර 10 (10%) |
| වෙනත් | වසර 10 (10%) |

වත්කමක ක්ෂයවීම් අනුපාතයේ, ශේෂ වටිනාකමේ ප්‍රයොජ්‍ය ආයු කාලයේ සැලකිය යුතු වෙනසක් සිදුව තිබෙන බව පෙන්නුම් කරන්නේ නම්, එම වත්කමේ ක්ෂයවීම, නව අපේක්ෂණය පිළිබිඹු කිරීම පිණිස අනාගතය ගැන සැලකිල්ලට ගනිමින් ප්‍රතිශෝධනය කරනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වා ගැනීම පිණිස දේපළ, පිරියත හෝ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව පිණිස දරන ලද වියදම්, එසේ දැරූ විටදී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

## 2.2. අස්පෘශ්‍ය වත්කම්

මෘදුකාංග මිලදී ගැනීම සඳහා දරන ලද වියදම් අස්පෘශ්‍ය වත්කමක් සේ පිළිගනු ලබන අතර එම වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍යවත් ආයු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රධාන වාර්ෂික අනුපාත පහත දැක්වෙන පරිදි වේ.

| | |
|---|---|
| අස්පෘශ්‍ය වත්කම් | වසර 20 (5%) |

## 3. වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැයට තක්සේරු කොට ඇත.

## 4. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහා මුදල් සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්වලින් සමන්විත වේ.

## 5. බැරකම්

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැදීමක් තිබෙන විටදී ශේෂ පත්‍රයේ බැරකම් පිළිගනු ලැබේ. ණය හිමියකුගේ ඉල්ලීම මත ගෙවිය යුතු හෝ ශේෂ පත්‍රයේ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැදීම්, ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් ලෙස සලකනු ලැබේ.

## 6. ආදායම පිළිගැනීම

ප්‍රාග්ධන ප්‍රදානය විලම්භිත ආදායමක් ලෙස පිළිගෙන තිබේ. පුනරාවර්තන වියදම කාලසීමාව තුළ ආදායමක් ලෙස පිළිගෙන ඇති අතර ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ. සියලු වියදම් උපචිත පදනමින් පිළිගෙන ඇත.

## 7. දායකත්ව සැලසුම්

මණ්ඩලය සේවකයන්ගේ දළ වැටුපෙන් අනුපිළිවෙලින් 12% ක් සහ 3%ක් අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල වෙනුවෙන් දායක කරයි.

## 8. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබේ.

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
**2021.12.31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්**

| සටහන: 9 | 2021 | 2020 |
|---|---|---|
| **පුනරාවර්තන ප්‍රතිපූරණය** | රු. | රු. |
| පුනරාවර්තන ප්‍රතිපූරණය (9.1) | 22,883,000.00 | 20,135,500.00 |
| **එකතුව** | **22,883,000.00** | **20,135,500.00** |

| සටහන: **10** | 2021 | 2020 |
|---|---|---|
| **සේවක පඩිනඩි** | රු. | රු. |
| කාර්ය මණ්ඩල වැටුප් | 11,594,640.25 | 7,160,254.30 |
| සේ.අ.අ. දායක මුදල් | 1,173,602.14 | 629,531.50 |
| සේ,භා.අ. දායක මුදල් | 293,400.54 | 157,382.80 |
| අතිකාල | 198,321.69 | 121,774.73 |
| පාරිතෝෂික වියදම | 193,992.50 | 212,337.00 |
| නව බඳවාගැනීම් සඳහා වියදම් | 24,575.00 | 25,287.00 |
| උත්සව ණය මත සිදුවූ වියදම | 4.39 | - |
| **එකතුව** | **13,478,536.51** | **8,306,567.51** |

| සටහන: **11** | 2021 | 2020 |
|---|---|---|
| **සැපයුම් සහ පරිභෝජ්‍ය ද්‍රව්‍ය** | රු. | රු. |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 159,748.49 | 65,771.69 |
| ඉන්ධන | 215,668.00 | 126,370.00 |
| ආහාර/ සැහැල්ලු ආහාර පාන | 48,571.00 | 35,969.00 |
| **එකතුව** | **423,987.49** | **228,110.69** |

| සටහන: **12** | 2021 | 2020 |
|---|---|---|
| **නඩත්තුව** | රු. | රු. |
| වාහන නඩත්තුව | 331,363.97 | 288,761.21 |
| කාර්යාල උපකරණ නඩත්තුව (පරිගණක හා යන්ත්‍රෝපකරණ) | 175,522.09 | 92,988.18 |
| **එකතුව** | **506,886.06** | **381,749.39** |

| සටහන: **13** | 2021 | 2020 |
|---|---|---|
| **ගිවිසුම්කර සේවා** | රු. | රු. |
| තැපැල් ගාස්තු | 14,885.00 | 13,215.00 |
| දුරකථන/අන්තර්ජාල ගාස්තු | 154,553.66 | 134,193.60 |
| ගොඩනැගිලි කුලිය/පිරිසිදු කිරීමේ සේවා | 8,611,188.03 | 8,207,678.99 |
| විදුලි ගාස්තු | 602,320.84 | 501,946.33 |
| පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු සහ සංග්‍රහ | 848,913.00 | 512,956.00 |
| වෙළඳ ප්‍රවාරණ/ අනෙකුත් වියදම් | 164,989.00 | 192,053.50 |
| | 660,000.00 | 900,000.00 |
| **එකතුව** | **11,056,849.53** | **10,462,043.42** |

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
**2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්**

| සටහන: 14 | 2021 | 2020 |
|---|---|---|
| **ක්ෂයවීම - දේපළ, පිරියත හා උපකරණ** | රු. | රු. |
| ගොඩනැගිලි සහ සවිකිරීම් | 99,290.00 | 99,290.00 |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ | 158,288.22 | 172,150.83 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 180,960.95 | 186,558.39 |
| පරිගණක | 399,897.72 | 678,204.93 |
| වාහන | 1,414,350.00 | 1,414,350.00 |
| වෙනත් | 28,428.38 | 26,861.31 |
| **ක්ෂයවීම- අස්පෘශ්‍ය වත්කම්** | | |
| අස්පෘශ්‍ය වත්කම් | 302,735.92 | 281,724.69 |
| **එකතුව** | **2,583,951.19** | **2,859,140.14** |

| සටහන: 15 | 2021 | 2020 |
|---|---|---|
| **මූල්‍ය පිරිවැය** | රු. | රු. |
| බැංකු ගාස්තු | 6,300.00 | 6,855.00 |
| **එකතුව** | **6,300.00** | **6,855.00** |

| සටහන: 16 | 2021 | 2020 |
|---|---|---|
| **පිරියත හා උපකරණ** (16.1) | රු. | රු. |
| ගොඩනැගිලි සහ සවිකිරීම් | 2,004,422.34 | 2,103,712.34 |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ | 779,915.88 | 1,103,137.45 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 966,935.80 | 1,180,459.25 |
| පරිගණක | 1,608,685.61 | 892,764.16 |
| වාහන | 6,336,558.08 | 7,750,908.08 |
| වෙනත් | 205,262.61 | 223,960.00 |
| **එකතුව** | **11,901,780.33** | **13,154,942.28** |

| සටහන: 18 | 2021 | 2020 |
|---|---|---|
| **අස්පෘශ්‍ය වත්කම්** | රු. | රු. |
| අස්පෘශ්‍ය වත්කම් (18.1) | 8,567,995.49 | 3,400,510.25 |
| **එකතුව** | **8,567,995.49** | **3,400,510.25** |

| සටහන: 19 | 2021 | 2020 |
|---|---|---|
| **වට්ටෝරු භාණ්ඩ (19.1** | රු. | රු. |
| ලිපිද්‍රව්‍ය | 46,638.92 | 31,694.01 |
| කාර්යාල උපකරණ නඩත්තුව | - | - |
| **එකතුව** | **46,638.92** | **31,694.01** |

| සටහන: 20 | 2021 | 2020 |
|---|---|---|
| **මුදල් හා මුදල් සමාන දෑ** | රු. | රු. |
| ලංකා බැංකුව, බත්තරමුල්ල ශි/අ. 0077769376 2021.12.31 දිනට ශේෂය | 1,192,609.34 | 46,638.92 |

| | | |
|---|---|---|
| ලංකා බැංකුව තැපැල් ප්‍රොබේන් ගි/අ. 008724393 2021.12.31 දිනට ශේෂය | 5,399.66 | - |
| අතැති මුදල් | - | - |
| **එකතුව** | **1,198,009.00** | **46,638.92** |

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

**2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්**

| සටහන: 21 | 2021 | 2020 |
|---|---|---|
| **උපචිත වියදම්** | රු. | රු. |
| ඉදිරියට ගෙනා ශේෂය 2021.12.30 | - | 56,350.25 |
| අතිකාල | 59,396.08 | 19,505.00 |
| ඉන්ධන වියදම් | 10,920.00 | 10,920.00 |
| ගොඩනැගිලි කුලී/ පිරිසිදු කිරීමේ සේවා | - | 14,650.63 |
| විදුලිය | 72,422.80 | 78,982.19 |
| කාර්ය මණ්ඩල වැටුප් | 254,121.25 | 128,649.38 |
| දුරකථන/අන්තර්ජාල ගාස්තු | 14,218.43 | 12,771.99 |
| අනෙකුත් වියදම් (පුවත්පත් සැපයීම) | 1,320.00 | 3,480.00 |
| ආහාර වියදම් (පානීය ජලය සැපයුම) | 3,000.00 | 2,625.00 |
| 2018 වසර සඳහා උපචිත වියදම් මත අධි තක්සේරුව | - | (56,350.25) |
| **එකතුව** | **500,892.01** | **271,584.19** |

| සටහන: 22 | 2021 | 2020 |
|---|---|---|
| **ප්‍රතිපාදන** | රු. | රු. |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 687,157.50 | 493,165.00 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 4,368,000.00 | 4,284,000.00 |
| **එකතුව** | **5,055,157.50** | **4,777,165.00** |

| සටහන: 23 | 2021 | 2020 |
|---|---|---|
| **තැන්පතු** | රු. | රු. |
| පොදු තැන්පතු / ආදායම් වෙනත් | - | 450.00 |
| **එකතුව** | - | 450.00 |

| සටහන: 24 | 2021 | 2020 |
|---|---|---|
| **ප්‍රාග්ධනය හා සංචිත** | රු. | රු. |
| දූ.ම.ජා.අ. අරමුදල | 6,560,893.26 | 6,560,893.26 |
| **එකතුව** | **6,560,893.26** | **6,560,893.26** |

| සටහන: 25 | 2021 | 2020 |
|---|---|---|
| **රජයේ ප්‍රදානය- ප්‍රාග්ධන** | රු. | රු. |
| ඉ/ගෙ ශේෂය | 17,321,578.4 | 20,173,323.55 |
| ප්‍රාග්ධන ප්‍රතිපූරණය (25.1) | 5,357,000.00 | 1,112,000.00 |
| විදේශ ප්‍රදාන ප්‍රතිපූරණය (25.2) | 7,147,165.00 | - |
| ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය (දේපළ හා උපකරණ, බුද්ධිමය දේපළ, අස්පෘශ්‍ය වත්කම් මත ක්ෂය) | (2,583,951.20) | (2,859,140.14) |
| වර්ෂය සඳහා ආදායම් | (8,085,225.00) | (1,054,605.00) |
| **එකතුව** | **19,206,567.21** | **17,371,578.41** |

| සටහන: 26 | 2021 | 2020 |
|---|---|---|
| **ලැබිය යුතු දෑ** | රු. | රු. |
| ආපදා ණය | - | - |
| **එකතුව** | - | - |

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

| සටහන: 27 | 2021 | 2020 |
|---|---|---|
| පෙර වසරේ ගැලපීම | | රු. |
| ඉදිරියට ගෙනා ශේෂය | - | - |
| එකතුව | - | - |

| සටහන: 28 | 2021 | 2020 |
|---|---|---|
| පූර්ව ගෙවීම් | රු. | රු. |
| වැඩසටහන් සඳහා අත්තිකාරම් (ප්‍රාග්ධන අත්තිකාරම්) | - | - |
| ඉන්ධන සැපයුම්කරු සඳහා තැන්පතුව | 50,000.00 | 50,000.00 |
| උ.ගෙ. බදු පූර්ව ගෙවීම | - | - |
| එකතුව | 50,000.00 | 50,000.00 |

| සටහන: 29 | 2021 | 2020 |
|---|---|---|
| සමුච්චිත අතිරික්ත/හිඟය (ආදායම් හා වියදම් ගිණුම) | රු. | රු. |
| ඉ/ගෙ ශේෂය | (6,663,301.51) | (1,968,431.80) |
| කාලසීමාව සඳහා අතිරික්තය/ හිඟය | (1,523,419.22) | (1,337,219.96) |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 576,000.00 | (3,384,000.00) |
| 2018 වසර සඳහා උපචිත වියදම් ගිණුම මත අධි තක්සේරුව | - | 56,350.25 |
| ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය සඳහා ප්‍රතිපාදන | (3,536,000.00) | - |
| සමුච්චිත ක්ෂයවීම - අස්පෘශ්‍ය වත්කම් (2016 සිට 2018 දක්වා සමුච්චිත ක්ෂයවීම) | (1,155,241.15) | - |
| එකතුව | (9,961,479.56) | (6,633.301.51) |

| සටහන: 30 | 2021 | 2020 |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය | රු. | රු. |
| රජයේ ප්‍රදානය - ප්‍රාග්ධන (2018 දේපළ හා උපකරණ, බුද්ධිමය දේපළ, අස්පෘශ්‍ය වත්කම් මත ක්ෂයවීම්) | 2,583,951.20 | 2,859,140.14 |
| එකතුව | 2,583,951.20 | 2,859,140.14 |

| සටහන: 31 | 2021 | 2020 |
|---|---|---|
| ආදායම | රු. | රු. |
| ප්‍රාග්ධන ප්‍රතිපූරණය (25.1) | 4,026,060.00 | 1,054,605.00 |
| 2019 වසර සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලත් මුදල් | 4,059,165.00 | 1,203,537.01 |
| වෙනත් ආදායම් | 133,500.00 | |
| එකතුව | 8,218,725.00 | 2.258.142.01 |

| සටහන: 32 | 2021 | 2020 |
|---|---|---|
| වියදම් | රු. | රු. |
| වැඩසටහන් සඳහා වියදම් (භාණ්ඩාගාරයෙන් ලත් අරමුදල්) | 3,378,148.83 | 1,441,800.95 |
| වැඩසටහන් සඳහා වියදම් (ලෝ.සෞ.සං/බ්ලූම්බර්ග් වෙතින් ලත් අරමුදල්) | 3,774,435.81 | 2,994,185.01 |
| එකතුව | 7,152,584.64 | 4,345,985.96 |

| සටහන 33 | 2021 | 2020 |
|---|---|---|
| ප්‍රාග්ධන ලාභ | රු. | රු |

| | | |
|---|---|---|
| ප්‍රත්‍යාගණනය - පරිගණක හා පරිගණක උපකරණ | 486,569.17 | -. |
| ස්ථාවර තැන්පතු ඉවත් කිරීම් | (84,175.85 | - |
| එකතුව | **402,393.32** | - |

**සටහන 34:**

**වැරැදි සිදු වූ, ඉදිරිපත් කරන ලද පෙර කාල පරිච්ඡේද සඳහා, සන්සන්දනාත්මක සංඛ්‍යා නැවත ප්‍රකාශ කිරීම මඟින් හෙළිදරව් කිරීම් (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 03)**

- 2016 සිට 2020 දක්වා ඵගය එකතු කළ බද්ද ඉවත් කර නිකුත් කරන ලද ඉන්වොයිසි මත පදනම්ව 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය රු. 576,000.00 ලෙස ගලපා ඇත.

- ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය සඳහා ලැබීමට නියමිත රු. 3,536,000.00 2020 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොමැත. එබැවින් සමාලෝචිත වර්ෂයේ හිඟය මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇත. 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනවල මෙය නිවැරැදි කර ඇත.

- රු. 1,155.241.16 ක් වූ දේපළ, පිරියත හා උපකරණ යටතේ නිවැරදි කළ ශ්‍රව්‍ය, දෘශ්‍ය උපකරණ මත අධික්ෂයකිරීම සමුච්චිත අතිරික්ත/හිඟ ගිණුමට ගලපා නොමැත. එම තත්ත්වය යටතේ අස්පෘශ්‍ය වත්කම්වල ශුද්ධ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් ප්‍රකාශ කර ඇත. 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනවල මෙය නිවැරැදි කර ඇත.

- ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 82 ඡේදය ප්‍රකාරව, 2020 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු. 493.165.00 ක් වූ අතර එය ජංගම නොවන බැරකම් යටත් සඳහන් කරනු වෙනුවට ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි. 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනවල මෙය නිවැරැදි කර පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ජංගම නොවන බැරකම් යතේ දක්වා තිබේ.

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

**2021.12.31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**සටහන 35**

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන අනෙකුත් ආයතන | දරන තනතුර | පත්වීමේ දිනය | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| **වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා,** සභාපති, මද්‍යසාර හා දුම්කොළ පිළිබඳ ජාතික අධිකාරිය | - | - | - | - |
| **පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි** ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී | | | | |
| **වෛද්‍ය ලක්ෂ්මී සෝමතුංග මිය** අතිරේක ලේකම්, (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය අමාත්‍යාංශය | ජාතික වකුගඩු පදනම | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 2021 පෙබරවාරි | |
| | වික්ටෝරියා නිවාසය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 2020 ජනවාරි | නිත්‍ය සාමාජික |

| | | | | |
|---|---|---|---|---|
| | ආබාධිත සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය | සාමාජික | 2021 ඔක්තෝබර් | - |
| | මධ්‍යම පරිසර අධිකාරියේ පාරසරික සභාව | සාමාජික | 2021 අප්‍රේල් | |
| **සුමිත් අබේසිංහ මහතා**<br>ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී | ශ්‍රී ලංකා මූල්‍ය කොමිසම | සභාපති | 03.12.2020 | වසර 03යි |
| | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | සාමාජික | 2020 මාර්තු | වසර 03යි |
| **සුධීර ජයරත්න මහතා**<br>අධ්‍යක්ෂ- කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය | ජාතික ශිල්ප සභාව | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 05.01.2020 | වසර 02 යි |
| **ආචාර්ය කේ.අජිත් රෝහණ මහතා**<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, | ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 2021 | - |
| | අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 2021 | - |
| | | | 2021 | - |
| **සමන් ජයසිංහ මහතා,**<br>අතිරේක ලේකම් - වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 19.02.2020 | මාස 08 යි |
| | ලංකා සතොස සමාගම | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 05.02.2020 | මාස 08යි |
| | ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 08.08.2018 | අවුරුදු එකයි. |
| **එම්.ජේ. ගුණසිරි මහතා**<br>සුරාබදු කොමසාරිස් ජෙනරාල් | - | - | | - |
| **ආර්.පී. සත්කුමාර මහතා**<br>අතිරේක ලේකම්, තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | අමාත්‍යාංශයේ නියෝජිත | 12.07.2021 | - |
| | සැලසිනේ රූපවාහිනී ආයතනය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 23.02.2021 | - |
| **වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු**<br>සභාපති, අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය | සභාපති | 07.06.2021 | වසර 03යි |
| **හිරණ්‍යා පෙරේරා මිය**<br>අධිකරණ අමාත්‍යාංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව | කොමසාරිස් | 18.02.2019 | වසර 03යි |
| **බී.එම්එස්. බණ්ඩාර මහතා**<br>අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය | ජාතික නව්‍යකරණ නියෝජිතායතනය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි | 2021 ජූනි | වසර 03යි |
| **සුනිල් ශාන්ත වීරසේකර මහතා**<br>ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත | සාමාජික | 30.12.2019 | වසර 05යි |
| | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, උපදේශක මණ්ඩලය | සාමාජික | 01.02.2020 | වසර 03 යි |
| | බෞද්ධ කටයුතු අංශය, ජනාධිපති ලේකම් කාර්යාලය | අධ්‍යක්ෂ | 2021 | - |
| **ජී. කමණී ගුණරත්න මිය** | - | - | - | - |

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ, පාසල් සෞඛ්‍ය හා පෝෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය | | | | |
| **විජයන්ති රත්නායක මිය**<br>ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී | - | - | - | - |

## 14.3 විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ටීඑච්ඔ/බී/එන්ඒටීඒ/01/ 2021/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2022 ජූනි 30 දින |

සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය.

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : 01. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } ටීඑච්ඕ/බී/එන්ඒටීඒ/ 1/21/03 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 ජුනි 30 දින |

සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 8

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 49 ඡේදය ප්‍රකාරව, වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අදාළ වත්කම් පන්තිය එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව අධිකාරිය සතු පරිගණක හා උපකරණ අතරින් 2017 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු ශුද්ධ අගය රු.257,180 ක් වූ පරිගණක හා උපකරණ පමණක් 2022 පෙබරවාරි 28 දින රු.743,750 කට ප්‍රත්‍යාගණනය කර රු.486,570 ක ප්‍රත්‍යාගණන ලාභයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම එම ප්‍රත්‍යාගණන අගය මත පදනම්ව රු.148,750 ක ක්ෂය ගණනය කර ගිණුම්ගත කර තිබුණි. තවද මෙම ප්‍රත්‍යාගණනයට අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් ඉවත් කර තිබුණු ධාරණ අගය රු.102,475 ක් වූ විවිධ වත්කම් වර්ග 10 ක් විකිණීමෙන් ඇතිවී තිබුණු රු.84,175 ක අලාභය සමාලෝචිත වර්ෂයේ ආදායමට ලියාහරිනු වෙනුවට පරිගණක හා උපකරණ ප්‍රත්‍යාගණනයෙන් ජනනය වී තිබුණු ලාභයට එරෙහිව ගළපා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඊට සමාන අගයකින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කර නොතිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.377,590 කින් වැඩියෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.102,475 කින් අඩුවෙන්ද හා 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල අගය රු.275,115 ක් අඩුවෙන්ද දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පිටුව 2 | 8

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 2021 දෙසැම්බර් 31 දිනට රු.32,489,006 ක් වූ දේපල පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය හා ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් කළ හැකි වන පරිදි විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ඒ වෙනුවට වත්කම් අයිතම ප්‍රමාණය දැක්වෙන පරිදි ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය පමණක් පවත්වා තිබුණි. |
| (ආ) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් රාජ්‍ය නිලධරයන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කළ යුතු වුවද, අධිකාරිය සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණු නීති නිලධාරියාගේ පැමිණීම හා පිටවීම අධිකාරියේ ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රය තුළ සටහන් කර නොතිබුණි. පැමිණීම හා පිටවීම කිසිදු ආකාරයකින් සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී එම නිලධාරියාගේ දළ වැටුප් හා දීමනා ලෙස රු.841,455 ක් වැයකර තිබුණි. |

පිටුව 5 | 8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| (ඇ) | 2019 අප්‍රේල් 22 දිනැති අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2019 ජූලි 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණු 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය නිලධරයන් සඳහා මාසිකව ගෙවීමට අනුමත කර තිබුණු රු.2,500 ක අන්තර් දීමනාව අර්ධ රාජ්‍ය සේවකයින්ට ගෙවිය නොහැකි නමුත්, 2019 ජූලි මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා වූ මාස 30 ක කාලය තුළදී අධිකාරියේ නිලධාරීන් 13 දෙනෙකු වෙත රු.690,648 ක් අන්තර් දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඇ) | 2021 ජූනි 15 දිනැති අංක 21/Misc (032) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 ජූනි 16 දිනැති අංක MIN/add/See/Admin/16/21 දරන ලිපිය | 2021 ජූනි මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා වූ මාස 03 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් සෞඛ්‍ය සේවයේ නියුතු කාර්යය මණ්ඩලය සඳහා මාසිකව ගෙවීමට අනුමත කර තිබුණු රු.7,500 ක විශේෂ මාසික දීමනාව අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත ගෙවිය නොහැකි නමුත්, 2021 ජූනි මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා වූ මාස 03 ක කාලය තුළදී අධිකාරියේ කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකු වෙත රු.262,375 ක් විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සමාලෝචිත වර්ෂය තුළදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබාදීමට එකඟවී තිබුණු රු.2,979,900 ක මූල්‍ය ප්‍රදාන උපයෝගී කරගෙන දුම්කොළ වගාවෙන් තොර තිරසාර දිස්ත්‍රික්ක නිර්මාණය කිරීමේ නියමු ව්‍යාපෘතිය (Creating Sustainable tobacco Cultivation free districts through a pilot test) යටතේ අනුරාධපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක 02 හි දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වා තිබුණි. නමුත් එම වැඩසටහන් සඳහා අවශ්‍ය ආහාර හා නවාතැන් පහසුකම් සපයා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කරමින්, විද්‍යුත් තැපැල හරහා කැඳවා තිබුණු මිල ගණන් මත පදනම්ව හා ප්‍රසම්පාදන කමිටුවක් මගින් සැපයුම්කරුවන් තෝරා ගැනීම වෙනුවට අධිකාරියේ සභාපතිවරයා විසින් තෝරා ගෙන තිබුණු සැපයුම්කරුවන්ගෙන් ආහාර හා නවාතැන් පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් රු.1,350,104 ක් ගෙවා තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයේ විනිවිදභාවය ආරක්ෂාවී නොතිබුණි.

පිටුව 6 | 8

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව, උපායමාර්ග 07 ක් යටතේ උපකාර්යයන් 27 ක් වෙනුවෙන් රු.25,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණු නමුත් රු.5,357,000 ක් භාණ්ඩාගාරයෙන්ද, රු.9,770,150 ක් විදේශ ප්‍රදානවලින්ද වශයෙන් එකතුව රු.15,127,150 ක් පමණක් ලැබී තිබුණු බැවින්, උපකාර්යයන් 19 ක් පමණක් සිදුකර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම මත සැලසුම්කර තිබුණු උපකාර්යයන් 08 ක් ඉටුකිරීමට නොහැකිවී තිබුණි. එසේම වර්ෂය තුළ සැලසුම් කර තිබුණු දුම් රහිත දුම්කොළ භාවිතයේ පාලනය සඳහා වැඩමුළු 10 ක් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා නොතිබුණු අතර ඒ වෙනුවට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව නොතිබුණු එහෙත් ඉහතින් දැක්වූ අරමුණට අදාළ කර ගත හැකි කාර්යයන් 03 ක් සිදු කර තිබුණි.

(ආ) අධිකාරිය සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ ඇති කරගෙන තිබුණු එකඟතාවයකට අනුව ගෝලීය වැඩිහිටි දුම්කොල සමීක්ෂණයේ අවසන් වාර්තාව 2021 ඔක්තෝබර් 31 දිනට පෙර නිකුත් කළ යුතු වුවද, 2022 මැයි 24 දින වන විටත් එම සමීක්ෂණයේ අවසන් වාර්තාව නිකුත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් 1948 මනෝ උපදේශන සේවාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු.1,380,500 ක්ද, එම සේවාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් රු.2,022,500 ක්ද හා එම සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් 1,205,085 ක් ද වශයෙන් මුළු එකතුව රු.4,608,085 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු ඇමතුම් 9,025 කින් ඇමතුම් 2,797 ක් වෙනුවෙන් උපදේශන සේවා සපයා තිබුණු අතර ඇමතුම් 1,084 ක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වැනි අදාළ ආයතන වෙත යොමු කර තිබුණි. ඇමතුම් 2,797 ක් වෙනුවෙන් උපදේශන සේවා සපයා තිබුණු නමුත් ඒ පිළිබඳ පසුවිපරමක් සිදු කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණු බැවින් එම සේවාවේ ඵලදායිතාවය මැනීමට අධිකාරියට නොහැකිවී තිබුණි.

(ඈ) 1948 උපදේශන සේවාව සඳහා දෛනිකව ලැබෙන ඇමතුම් සහ ඒවා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු ඇතුළත්වන පරිදි සහ එම තොරතුරු ඉහල නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක්වන බවට සනාථ කෙරෙන පරිදි විධිමත් ලේඛනයක් පවත්වා නොතිබුණු බැවින් 1948 උපදේශන සේවාවට ලද ඇමතුම් සහ සිදුකර තිබුණු උපදේශන සේවා සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු සංඛ්‍යාත්මක තොරතුරුවල නිවැරදිතාවය සනාථ කර ගත නොහැකි විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඉ) ඉකුත් වර්ෂවලදී විවිධ වැඩසටහන් සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මුද්‍රණය කර තිබුණු ස්ටිකර් 75,650 ක්, අත්පත්‍රිකා 47,828 ක් හා පෝස්ටර් 13,346 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරිව තිබුණු නමුත් ඒවා තවදුරටත් අධිකාරියේ අරමුණු වෙනුවෙන් භාවිතා කළ හැකිද යන්න පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.. එසේම 2021 නොවැම්බර් 15 දින අධිකාරිය විසින් මෙම තොග පිළිබඳ සිදුකර තිබුණු භෞතික පරීක්ෂණයකදී ඒකක 8,313 ක ඌනතාවයක් පවතින බව හඳුනාගෙන තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.


(ඊ) 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරිත්වයේ පැවති ඩෙස්ටොප් පරිගණක 03 ක්, ලැප්ටොප් පරිගණක 05 ක් සහ ටැබ්ලට් 06 ක් අධිකාරියේ කාර්යයන් වෙනුවෙන් භාවිත නොකර නිෂ්කාර්යව පැවතුණි. එසේම 2018 වර්ෂයේ දී Training of Trainers Program වැඩසටහන් සඳහා අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව මිලදී ගෙන තිබුණු පිරිවැය රු.160,421 ක් වූ Pen drive 119 ක්ද නිෂ්කාර්යව පැවතුණි.


ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටුව 8 | 8

# 15. කළමනාකරණ කණ්ඩායම/ කාර්ය මණ්ඩලය

## 15.1 සංවිධාන සටහන






## 15.2 2021.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

| තනතුරු නාමය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | | සිටින සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | ස්ථිර | කොන්ත්‍රාත් |
| සාමාන්‍යාධිකාරි | HM 1 - 1(2016) | 01 | - | 01 | - |
| ගණකාධිකාරි | MM 1 - 1(2016) | 01 | - | 01 | - |
| නීති නිලධාරි | - | - | 01 | - | 01 |
| පරිපාලන නිලධාරි | JM 1-1 (2016) | 01 | - | 01 | - |
| පර්යේෂණ නිලධාරි | MA 3 (2016) | 02 | - | 02 | - |
| සංවර්ධන නිලධාරි | MA 3 (2016) | 04 | 02 | 04 | 02 |
| උපදේශක | - | - | 02 | - | 02 |
| කළමනාකරණ සහායක | MA 1-1 (2016) | 01 | - | 01 | - |
| කම්කරු | PL - 1 (2016) | 02 | - | 02 | - |
| රියදුරු | PL - 3 (2016) | 02 | - | 02 | |
| **එකතුව** | | **14** | **05** | **14** | **05** |

National Authority on Tobacco and Alcohol
11th Floor, Wing A, Sethsiripaya, Stage II, Battaramulla.
Tel : +94 112 187 140 / Fax : +94 112 186 024
Web : www.nata.gov.lk
Email : natamoh.lk@gmail.com